ෆර්දාවෙන් වැසුනු රෝස කුසුම



# සරායා

කුෂාන් හෙට්ටිආරච්චි

©

මෙම කෘතිය කතුවරයාගේ පූර්ණ අනුමැති සහිතව

sinhalaebooks.com වෙබ් අඩවිය විසින්

පාඨකයන්ගේ කියවීම උදෙසා නොමිලේ බෙදාහරින ලද කෘතියකි.

Published with Author Consent.

සරායා .

කුෂාන් හෙට්ටිආරච්චි.

සරායා
Author
KUSHAN HETTIARACHCHI

# සරායා .




කුෂාන් හෙට්ටිආරච්චි.

PDF ප්‍රකාශනයකි

සරායා
Author
KUSHAN HETTIARACHCHI

# සරායා

© කුෂාන් හෙට්ටිආරච්චි.

ප්‍රථම PDF මුද්‍රණය 2017

දෙවන PDF මුද්‍රණය 2022

මෙම කෘතියේ සම්පූර්ණ අයිතිය කතෘ සතුවන අතර නිසි ලිඛිත අවසරයකින් තොරව මෙහි කිසිදු කොටසක් උපුටාගැනීම හෝ කවරාකාරයෙන් හෝ ප්‍රතිමුද්‍රණය,අන්තර්ජාල ප්‍රකාශනය .ව්‍යාජ පිටපත් පළකිරීම,අලෙවිය කිසිදු මාධ්‍යකින් සපුරා තහනම් ය.

Author
KUSHAN HETTIARACHCHI

**පිට කවර නිර්මාණය**

කුෂාන් හෙට්ටිආරච්චි.

සරායා
Author
KUSHAN HETTIARACHCHI

# පිදුම

මාගේ ආදරණීය මවට පියාට නැගනියට සහ
බිරිඳට .

........සරායා........

කතාව එක්තරා විදිහක ආදර කතාවක් කතාව ගොතපු එකක් උනාට මේකෙ ඉන්න චරිත ඇත්ත ජීවිතේ මගෙත් එක්ක හිටපු චරිත එහෙත් මෙහි එන බොහෝ සිදුවීම් සත්‍ය සිදුවීම් ඉතින් රස විදල බලන්න මේ කතාවත් ඔයාල ආදරෙන් වැලද ගනීවිද කියල .

මේ කියවෙන කතාව 1999 සිට 2001 අතර කාලයේ සමාජ පසුබිම ගැන කියවෙන කතාවක් බව කාරුණිකව සලකන්න ඒකාලයේ ෆේස් බුක් තියා NOKIA 3310 ෆෝන් එකක් වත් දකින්න තිබුන කාලයක් නොවේ NOKIA 3310 ෆෝන් එකක් වත් තිබුනේ හොදම සල්ලිකාරයෙක් අතේ පමණි තාක්ෂණික උපකරණ සාමාන්‍ය ජනයා අතරට ඇවිත් නොතිබුනේ ඒවායේ මිල අධික නිසාය. මොකද මේ කතාව තුල බොහෝවිට එළිදක්වන්නෙ සත්‍ය තොරතුරු අනුසාරයෙන් ගෙතූ දේවල් නිසා මා ඔබට හැදින්වීමක් කෙරුවෙමි .මේ චරිත තවමත් අප අතර ජීවත් වේ මගෙ ආදරණීය පාසල "නක්කාවත්ත මහින්ද මද්‍ය මහා විද්‍යාලය ජාතික පාසල " මෙහි සිප්සතර හැදෑරූ කිසිවෙකුටත් මෙහි එන චරිත අමතක වී තිබීමට නොහැකිය අනික විශේෂයෙන් කිවයුතුයි

මුලු ලංකාවෙන්ම ප්‍රථමයෙන් නොමිලේ පොත් බෙදා දුන්නෙ මගෙ පාසලේ .එවගේම පාසැලට ස්වර්ණමය යුගයක් හිමිකර දුන් අතුල අලගියවන්න විදුහල්පති තුමා විදුහල් ඉතිහාසයේ නොමැකෙන චරිතයකි . දෙලන සර් වික්‍රමසිංහ සර් ධර්ම කුමාර සර් ,විපුලසේන සර් බද්‍රා ටීචර් ඇතුලු කී නොකී සියලුම ගුරු මහත්ම මහත්මීන් අපව යහ මගට ගැනීමට අපමණ වෙහෙසක් දැරූහ .අද අපි යම් තැනක සතුටින් වැජඹේද ඒ ඔවුන් නිර්ලෝභීව කල අපමණ කැපවීම මිස අන් කවරක් වත් නොවේ . සම්පූර්ණයෙන්ම මාගේ මනසේ ඇඳී කතාවක් වන මෙය මාගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණයෙන් හෝ මෙහි කොටස් උපුටා ගැනීම,අන්තර්ජාලය හෝ වෙනත් මාද්‍යක පල කිරීම . සපුරා තහනම් වේ. ගුණදොස් විචාරය ඔබ සතුය මීට කුෂාන් (කුෂී)


කුෂාන් හෙට්ටිආරච්චි.

පරමකොටුව පාර,නක්කාවත්ත.

0773 398 938 | 0716 815 899|0777 194 198

facebook.com/kushan3000

kushan3000@gmail.com


2017 ඔක්තෝබර් 18

සරායා

"සඳ මුවා වෙලා වැහි වලාවකින් වාගෙයි ඔබෙ වත මේ ගිණි දන කතරේ "

මම කාරයේ රේඩියෝවේ හඬ වැඩි කලෙමි .

සංගීත් වික්‍රමසිංහ ගැයූ ඒ ගීතය මම බොහෝ ප්‍රියකල ගීතයකි

"මොකද තංගච්චි කෙනෙක් ට හිත ගියාද? "

ඒ මගේ යහලුවා ඩේවිඩ්. ඔහු වාහනය පදවමින් ම ඔහු සිංදුව මුමුනන්න විය.

"මේ හලෝ මට මේ සින්දුව අහන්න දීල උඹේ ඔය මලකඩ කාපු ටකරං වොයිස් එක වහ ගන්නවද ඩේවිඩ් "

"අම්මද බොල ඒකෙ ගනන් "

ඩේවිඩ් ඔහුගේ හුන්ඩායි ස්ටෙලා වර්ගයේ කාරය මග අයිනට වෙන්න නැවැත්තුවේය.

"උඹ සිංදුව අහපන් මන් කඩේට ගිහින් කන්න මොනව හරි ගේන්නම්. "

මම කුෂාන්. ඩේවිඩ් සහ මම නක්කාවත්ත ජාතික පාසලේ ජීව විද්‍යා අංශයෙන් උසස් පෙල කල සිසුන් වීමු .ඩේවිඩ් ගේ සහ මගේ විනෝදාංශය හවසට මේ වගේ රවුමක් යාමය .ඔහුගේ පියා මේ වාහනය අරන් දී තිබුනේ ඔහුගේ පාවිච්චියට ය.

මද වෙලාවකින් ඩේවිඩ් ආවේ එග් බන් පහකුත් කොකාකෝලා ලීටරයේ වීදුරු බෝතලයකුත් අරන් ය.

"ඈ බන් දැන් මේ බෝතලේ දෙන්න එන්න වෙනව නේද ?"

"ඇයි බන් උඹ දැක්කෙ නැද්ද මම ඩිකියෙ තිබ්බ බෝතලයක් අරන් යනව ."

"මම ඉතින් ඔය ඩ්‍රයිවර්ල කරන වැඩ බලන්නෙ නෑනේ. "

"ආ මම එතකොට ඩ්‍රයිවර් උඹ මහත්තය? "

"ඔව් එහෙම තමයි. "

මම ඔහුව ගනන් නොගෙන කිව්වෙමි.

"මේ දැන් මේ එග් බන් පහක් ගෙනාවෙ ඇයි? "

"තුනක් මට දෙකක් උඹට. "

"ඇයි උඹලගෙ මල්ලි මගින් නගිනව කිව්ව නේද උට නැද්ද? "

"ඕකව හලමු බන් ඕකා හෙන කේලමා නෙ,බංඩයියගේ කඩේටම තිබ්බෙ ඔය බනිස් පහ විතරයි. "

"ඕන මගුලක් ඉක්මනට යමු අර කෙල්ල මිස් වෙයි."

"යකො මීට් වෙන්න යන්නෙ මගෙ කෙල්ල උබෙ කෙල්ල නෙවෙයි. "

"හරි හරි උඹ පරක්කු වෙලා ගිහින් කෙලව ගනින්කො මම මේ සීට් එකටම වෙලා උඹ නාගන්න හැටි බලන් ඉන්නම්. "

"මේ කුෂාන් උඹ මේ බනිස් ගෙඩිය කාලා පාඩුවේ පැත්තකට වෙලා හිටපන් තේරුනාද? "

"ඒ ගමන මට එක බනිස් ගෙඩියයි ලු. "

"හරි හරි ඕනෙනම් පහම කාපන් වැඩේ ඉවරනෙ. "

සරායා Author KUSHAN HETTIARACHCHI

ඩේවිඩ් පැවසුවේ රථය පන ගන්වමිනි.

මටත් මොන මැනස් නේද අප්පා මම කොකාකෝලා එක කඩා උගුරු කීපයක් බී බනිසයක් කන්න ගත්තෙමි .

අපි මේ කලින් ඉස්කෝලෙන් පැනල ගෙදර ගියේ.ඩෙවිඩ් ගෙ ගර්ල් ෆ්රෙන්ඩ් නිරාශාව මීට් වෙන්න යාමටය .

අප එක පාසලේ උනත් ඔවුන් දෙදෙනා මීට් උනේ නාරම්මල දීය .

"ඒයි මචන් අන්න ඉස්සරහ පොලිසියෙන්. "

මම කියද්දී ඩේවිඩ් කරාස් යන "හඩින්" බ්‍රේක් ගැසුවේ ය.

"කෝ කෝ "

"අර ඉන්නෙ කන්න වගේ බලන්. "

මම දුර ඉන්න පොලිස් නිලදාරීන් දෙදෙනා අත දික්කර පෙන්නුවෙමි .

"අත දික් කරන්න එපා මෝඩයො සැක හිතයි. "

"හිතනවනම් හිතන සැකයක් හිතන්න වෙලා බන් හිමීට ඔය පාරෙන් හරවපන් කො. "

සරාගෝ Author KUSHAN HETTIARACHCHI

ඩෙවිඩ්ට ලයිශන් නොතිබුනි ඒ මදිවට මූ වාහනේ ඉන්සුවරන්ස් එකත් පරිස්සමට ගෙදර තියල ඇවිදින් ය .

පොලිස් නිළදාරීන් බලා සිටිද්දීම අපි වාහනය අතුරු පාරට දැම්මෙමු .

"දැන් මේ පාරෙන් ගිහින් කොහාටද? "

ඩේවිඩ් විමසිල්ලෙන් අසයි.

"මේ පාරෙන් ගිහින් කලුවලාගේ ගෙදර තමයි. "

ඉන්දික යනු අපගේ පන්තියේ සිටි මිතුරෙකි කලුවා යනු අප ඔහුට පටබැදි නමයි .

"පිස්සු කෙලින්න එපා බන් නිරාශා බලාගෙන ඇති."

ඩේවිඩ් කිව්වේ නෝක්කඩු සවරූපයෙනි.

"මම පිස්සුවක් කෙලියෙ නෑ බන් උබට ලයිශනුත් නෑ මේ බඩකඩිත්තුවේ ඉන්ශුවරන්ස් එකත් නෑ නිකමටවත් මේකට අත දැම්මොත් එක්කො වෙඩි කන්න වෙනව නැත්තන් කූරු ගනින්න වෙනව. "

මම කිව්වෙ තුන්වන බනිසත් කා කොකාකෝලා උගුරක් බොන ගමන් ය.

"කෝ දියන් ඕක මෙහාට උබේ බඩ ඇතුලෙ හිගන්නෙක් ඉන්නවද බන්. "

ඩේවිඩ් බනිස් උරය මගෙන් උදුරා ගත්තේ වාහනය අයිනට කර නවතාය.

"උඹ කන හැටියට හල්ක් වගේ ඉන්න ඕනේ එත් ඉතින් උබ හල්ක් ගෙ ඇඟිල්ලක් තරම් වත් නෑනේ. "

ඩේවිඩ් බනිස් ගෙඩි දෙකම කෑවේ මට කින්ඩිය දාන ගමන් ය .

"කලුව තාම ගෙදර ගිහින් නැතුව ඇති බන් ශිට් මේ මගුලෙ පොලිස් කාරයො හිටියනෙ . "

ඩේවිඩ් කිව්වෙ කණස්සල්ලෙනි.

"මන් කියන්නද අපි මෙහෙන් දාල ලඟ පාරක් තියනව ඉස්කෝලෙට යමුද? "

මම කියද්දී .

"ඒ මොන ඉටිගෙඩියකටද ආයේ ඉස්කෝලෙට යන්නෙ. "

ඩේවිඩ් ඇසුවේ මුහුනත් දෙක කරගෙනය.

"නෑ බං උඹ ඉයේ ආවෙ නෑනේ මායි කලුවයි

කෙමිස්ට්‍රි ලැබ්බෙක ගාව තිබ්බ කෝලිකුට්ටු ගහේ කෙහෙල් කැන කපල හැංගුව. "

"මොනව කුෂාන් උඹ ෆ්‍රීෆෙක්ට් කෙනෙක් නේද? ඔහොමද බන් අනිත් උන්ට ආදර්ශමත් වෙන්නෙ. " ඩේවිඩ් කිව්වෙ හිනාවෙමින් ය.

"ආදර්ශමත් වෙන්න කලින් කෙහෙල් කාල ඉන්න එපැයි ඕක දැක්කනම් මැත්ස් එකේ සනාල ඕකට වැඩේ දෙනව බන්. "

"දැන් ඕක කොහෙද හැංගුවෙ. "

"හැංගුවෙ නම් ධර්ම කුමාර සර් ගෙ කෙමෙස්ට්‍රි ලැබ් එකේ. "

"යකෝ උඹ සර්ට අහුවෙන්නෙ නැතිව ඕක කොහොමද ලැබ් එකේ හැංගුවෙ දැන් ඉස්කෝලෙට ගිහින් ඕක බලන්න බෑනේ ලැබ් එක වහල ඇති. "

"මේන් ."

මම අලුතින්ම කපා ගත් කෙමිස්ට්‍රි ලැබ් එකේ ඩුප්ලිකේට් යතුර ඩේවිඩ් ට පෙන්නුවෙමි.

"උඹ නම් මාර පොරක් කුෂාන් අහුවෙන්නෙ නැතුව

ඕවා කොහොමද කරන්නෙ උඹ මේ අවුරුදු දොලහටම කේස් එකක් දාගෙන නෑ නේද? "

"ඒකට තමයි බන් මොළයක් දීල තියෙන්නෙ මමයි කලුවයි රංජනුයි වැඩේ කලේ සර් නැති වෙලාවක් බලල ඇතුලෙ හිස් කබඩ් එකක හංගල යතුර වෙනතැනකින් අරන් තිබ්බ. "

"ඔව් උඹට කෙළ උන දාට අපිට තමයි ඒ පරිප්පුව කන්න වෙන්නෙ,අනික කලුව නම් අවුලක් නෑ ඔය රංජන් නම් දෙපිට කාට්ටුව .ඕකා සර් ලට ටීචලට මුච්චිය අල්ලනව ,අපි දැන් ඉස්කෝලෙට ගිහින් චාටර් වෙයිද? "

Author
KUSHAN HETTIARACHCHI

"නෑ නෑ හිමීට කිච්චු කරල බලමුකො යංකො. "

ඩේවිඩ් වාහනය පාරට අරන් මම පෙන්වූ අතුරු පාරේ පදවන්න විය

"මේ අලුතින් කෙල්ලක් එනවලුද අපේ බයෝ එකට.
"

මම ඇසුවේ ඩේවිඩ් දෙස බලාගෙනය.

"මම දන්නෙ නෑ මට කෙල්ලක් ඉන්නවනෙ මම උඹ වගේ හැමතැනම ඉන්න කෙල්ලො ගැන

හොයන්නෙ නෑනෙ. "

"මම හොයන්නෙත් නෑ මට හරිහමන් කෙල්ලෙක් හිටියනම්. "

"ඇයි දැන් අර නවය වසරෙ දිනේශා ඒකට මොකද? "

"ඒකි මට කැමති නෑ බන්. "

"පල පල මට සුදුලූනු පොඩි කරන්නෙ නැතුව. "

අපි අතුරු පාරෙන් එන විට අපදෙසට එන රුවක් පෙනුනි.

"ඒ බන් ඩෙලෝ අර එන්නෙ ලෝකල් ප්‍රියා නේද? "

ලෝකල් ප්‍රියා යනු අපේ උසස්පෙළ කලා අංශයේ සිසුවෙකු වූ නුවන් විජේබංඩාරයි. ප්‍රියා සූරියසේන මහතාගේ සිංන්දු එලෙසම ගායනා කිරීමේ හැකියාවක් ඔහුට තිබුනි. කලා අංශයේ උනත් විද්‍යා පංතියේ අප සමග ඔහු බොහෝ කුලුපග වූයේ ඔහුත් නක්කවත්ත ජාතික පාසලේ සිටි පැරණි සිසුවෙකු නිසාය.

"ඔව් ඕකා ඇයි අද පයින්. වෙනද පියරුවගෙ බයිසිකලේ නේද යන්නෙ ."

සරායා Author KUSHAN HETTIARACHCHI

"ඔව් ඔව් අද පියරුව නැතුව ඇති .මේ ඩෙලෝ ඕකවත් දාගෙන යං. "

ඬේවිඩ් ඔහු යන මග හරස් කර වාහනය නැවැත්වීය .

අපි දෙදෙනාම කාරෙකෙන් බැස්සෙ එකටයි.

"අඩෝ උබල දෙන්න ඉවරයි අද. "

නුවන් අප ලඟට ආවේ එසේ කියාගෙනමය .

"ඇයි බන් මොකක්ද අවුල. "

"උබල දෙන්න කලින් යනව දෙලන සරුයි වික්‍රමසිංහ සරුයි දැකල. "

"ඉතින් බන් මොකක්ද අවුල මට උණ ගැනිලනෙ කලින් ආවෙ බද්‍රා මිස් අපට යන්න පර්මිශන් දුන්න. "

මම කීවෙමි.

මම සහ ඬේවිඩ් කලින් ආවේ මට උණ කියා බොරු ලෙඩක් ගැනීමෙනි.

මම කවදාවත් වැරැද්දක් කොට අසුවී නැති නිසා කවුරුත් මාව සැක කලේ නැත.

"නුවන් නැගපන් කෝ කාර් එකට "

කියමින් මම යළි කාර් එකට නැගුනෙමි.

"කොහෙ යන්නද බන් ."

"ඉස්කෝලෙට මුං ඊයෙ අර කෝලිකුට්ටු කැනට වැඩේ දීල ඒක අරන් එන්න යන්නෙ. "

කියමින් ඩේවිඩ් ද කාරයට නැගුනි නුවනුත් පසුපස සීට් එකට නැගී පාසලට යාමට පිටත් උනෙමු.

"මචන් ලා අපි ඉස්කෝලෙ වැව පැත්තෙන් එමු නේද? "

නුවන් පැවසුවේ ඉස්කෝලය ඉදිරියේ තවමත් ළමයින් සහ ගුරුවරුන් කිහිපදෙනෙක් හිටි නිසාය. අපි ඉස්කෝලය පාස් කර උඩහ ගේට්ටුව ලඟ අතුරු පාරෙන් කාරය හරවද්දී එතන බස් නැවතුමේ අප පන්තියේ හර්ශ දේව තනිවම ඉඳගෙන සිටිනු දුටු ඩේවිඩ් කාරය නවතා .

"ඒයි මචන් හර්ශ වරෙන්කො " යි කතා කලේය.

හර්ශයා අප දෙසට ආවේ සිනා සීගෙනය .

"ඒයි උඹ මොකද අද මෙච්චර වෙලා. "

මම ඇසුවේ හර්ශගෙනි

"මම කෙමිස්ට්‍රි ප්‍රැක්ටිකල් වගයක් එන්ටර් කලා. "

"නැගපන් කාර් එකට. "

"කොහෙද යන්නෙ. "

"කෙසෙල් හොරකමේ."

ඩේවිඩ් පැවසුවේ සිනා සීගෙනය.

අපි ඉස්කෝලේ වටෙන් ගොස් වැව තිබෙන හරියට ආවෙමු.එතනින් පාර ඉවරවේ අපි එතනම තියෙන පිට්ටනියේ ගලට වැටෙන් පැන ආවෙමු .ඉන්පසු තිබෙන්නෙ වැවේ බන්ට් එකයි එය කැලෑවැවී ඇති නිසා කාටවත් වැව් බන්ට් එකෙ යන කවුරුත් නොපෙනේ. අපි හතර දෙනා හොර පූසන් මෙන් වැව් බන්ට් එක දිගේ පැමිණ දර්ම කුමාර සර් ගේ කෙමිස්ට්‍රි ලැබ් එක පිටුපසට ආවෙමු .

"දැන් මමයි හර්ශයි ගිහින් ලැබ් එක අරිනව ඊට පස්සෙ අරක මේ ජනේලෙ ඇරල මම දෙන්නම් ඔය දෙන්න ඒක කාර් එකේ ඩිකියට දා ගන්න අපි දෙන්න ගේට් එක ලඟට මේ පැත්තෙන් එන්නම්. "

මම මගේ සැලසුම පිරිසට කීව්වෙමි .

"යමු එහෙනම් " හර්ශයා ඉස්සර විය

අපි දෙදෙනා වෙනසක් නැතිව ඩුප්ලිකේට්

යතුරෙන් දොර ඇර ගත්තෙමු. මම කබඩ් එකේ යතුර සඟවා තැබූ තැනින් ගෙන කබඩ් එක ඇර කෙසෙල් කැන දෙස බැලුවෙමි .එය ගානට ඉදී තිබේ අපි එය ගෙන ලැබ් එකේ එහා පස ජනේලය ඇර අමාරුවෙන් ඩේවිඩ් අතට දුන්නෙමු .ඔවුන් දෙදෙනා එය ගෙන විජහට වැව් බන්ට් එක දිගේ නොපෙනී ගියෝය.අප ජනේලය වසා එළියට එන්න හදද්දී.

"ළමායි මොකද මේ හවස් වෙලා. "

දෙයියනේ අලගියවන්න සර් හර්ශයා බිය වී සිටියි .

අලගියවන්න සර් යනු අපගේ විදුහල්පති තුමයි .

KUSHAN HETTIARACHCHI

මම බිය නැතිව එළියට ගියෙමි .

"සර් අපි දෙන්න ප්‍රැක්ටිකල් පොත් අරන් යන්න ආවේ දවස් හතරක් නිවාඩු නිසා."

"එතකොට කුෂාන් ගෙ යුනිෆෝර්ම් එක කෝ."

අලගියවන්න සර් අහපු ප්‍රශ්නයට වෙන කෙනෙක්ටනම් වචන පැටලී ගොත ගැහෙනව ස්තීරයි.

"සර් මම උණ හැදිල අද කලින් ගියානේ මේ ආවෙ

බෙහෙත් ගේන්න ගිය ගමන් අපේ හර්ශ කෙමෙස්ට්‍රි විශය නායකයනෙ එයා ලඟ ලැබ් එකේ ඩුප්ලිකේට් යතුර තියනව. "

"දැන් අවශ්‍ය පොත් ගත්තද ?"

"ඔව් සර් "

"එහෙනම් දැන් ගෙවල් වලට යන්න අඟහරුවාදා අලුත් ළමයි පිළිගන්න උත්සවේ වැඩටික කෙරෙනව නේද?"

"ඔව් සර් "

අලගියවන්න සර් නික්මගිය පසු අප දෙදෙනා පාරට ආවෙමු .

ඒ වනවිටත් ඩේවිඩ් සහ නුවන් අනිත් පසින් පැමිණ සිටියෝය .

"හර්ශ අද ගෙදරද යන්නෙ. "

ඩේවිඩ් එසේ ඇසුවේ හර්ශගේ ගෙවල් කලුගමුවේ උවත් වැඩි හරියක් ඔහු නැවතී සිටියේ කලුවලාගේ ගෙදර නිසාය.

"අද ගෙදර යන්න හිටියෙ ඒත් කලුවලාගෙ දිහා යන්නත් නම් පුලුවන් ."

"එහෙනම් කලුවලාගෙ දිහා ගිහින් කෙසෙල් කමු. "
මම කිව් කතාවට කවුරුත් සිනාසුනහ.
අපි කලුවලාගෙ ගෙදර ගොස් එන විට රාත්‍රී හත පමණ වී තිබුනි.
හෙට ඉතින් ආයේ ක්ලාස්ස් යන්නත් එපැයි.
"මම උදේ හත හමාර  වෙද්දි එනව කම්මැලියා නැගිටල ඉඳපන්."
ඩේවිඩ් කාරය හරවාගෙන එහෙම්මම ගියේ පරක්කු වී තිබුණ නිසාය.
අපි කුරුණෑගල ක්ලාස් ගියේ අටයි විස්සෙ අජිත් අයියගෙ සීටීබී බස් එකේ.
මම  පසුවදා ඇහැරෙද්දි  උදේ හයයි හතලිස්පහ වී තිබුනි .ඉක්මනින් බාත් රූම් එකට වැදී සීතලේ උනත් නා ගත්තෙමි .
"ජීවිතය සුන්දරද මෙතරම් සුවඳ දැනී දැනෙනව. "
මට මුමුනන්න හම්බුනේ එපමනයි කව්දෝ බාත් රූම් එකේ දොරට තඩි බායි.
"කව්ද යකෝ මේ උදේ පාන්දර දොර කඩන්න හදන්නෙ. "

Author
KUSHAN HETTIARACHCHI

මම මටම කියා ගනිමින් ටවල් එක පටලාගෙන දොර ඇරියෙමි .

"අම්මට සිරි ඩේවිඩා තාම හතයි නෙ බන්. "

මම කිව්වේ බාත් රූම් එකේ දොර ගාවට පේන කුස්සියේ ඔරලෝසුව දෙස බලමින්

"හුටා අටට පහයි එහෙම උනේ කොහොමද මම නැගිට්ටෙ හයයි  හතලිස් පහටනෙ. "

මම කීවේ ඩේවිඩ් දෙස බලාගෙනය.

"උබෙ කාමරේ ඔරලෝසුව හයයි හතලිස් පහට තමයි හිටල තියෙන්නෙ. කොහෙද ඕව බලන එකක් ය ,හරි හරි ලෑස්ති වියන් නැත්තන් බස් එක අල්ලන්න වෙන්නෙ නෑ. "

මටමමයි වෙන්නෙ මේ මගුල හිටලනෙ තිබිල තියෙන්නෙ .

මම ඉක්මනික් කාමරයට වැදී නිල්පාට ඩෙනිමට බැඝ සුදු ටීශර්ට් එකක් දා ගත්තෙමි .බයෝ පොතයි කෙමිස්ට්‍රි පොතයි බෑගයට දමාගෙන කාමරෙන් එලියට එනවිට අම්මා මටයි ඩේවිඩ් ටයි කිරි දෙකක් හදාගෙන ආවාය .උගුරට දෙකට කිරි

එක බිච්චෙ අමාරුවෙනි මම පුරුදු වී තිබුනේ රස්නෙ දේවල් නිවා බොන්නය .අම්මා ඔතා දුන් බත් මුලද බෑගයේ ඔබාගෙන පාරට දිව ආවෙමු.

අපි පාරට එනවිටම අජිත් අයියාගේ බස් එක ඈතින් එනු පෙනුනි .දුවගෙන ගොස් අප දෙදෙනා බසයේ එල්ලුනේ එය නවත්තන්නත් කලින් ය .බසයේ තෙරපී යන්තන් ගොඩවූ අපි සිටියේ පිටුපස ෆුට් බෝර්ඩ් එක ලගය. බසය නාරම්මල ස්ටෑන්ඩ් එකේ නැවැත්තුවේ සෙනගට නගින්නය. බසයට ගොඩ වූ කෙනා දැකීමෙන් ඩේවිඩ් ගේ මුහුණේ නම් මලක් පිපුනා වැනිය .ඒත් ඒ සතුට පැවතුනේ සුලු මොහොතකි. මටත් ගස්සගෙන ඩේවිඩ් ටත් රවාගෙන බසයට නැග්ගේ නිරාශාය.අද හරි වගේ ය .තුන්වන ලෝක යුද්දය අත ලඟයි .නිරාශා අප දෙදෙනාම පසු කරන් බසයේ මැදටම ඇදුනේ අපිව නොහදුනන ලෙසිනි .
"බන් මොකද අරයට ඩෝං ගිහින්. "
මම ඩේවිඩ් ට කිට්ටු කර ඇසුවෙමි.

"ඊයේ කණුවක් තිබ්බ හින්ද තමයි ඔය නැත්තන් අපේ මහා පරිමාණ කෙසෙල් වංචාව දැනගෙනවත් ද ,අනික මට උඹව ආශ්‍රය කරන්න එපා කියලනෙ තියෙන්නෙත්."

ඩේවිඩ් පවසද්දී...

"ආ ඇත්තද අප්පුහාමි ඒකිත් එක්කම හිටපන් එහෙනම්. "

මම බස්සෙකෙන් බැස ගොස් ඉස්සරහ ෆුට් බෝර්ඩ් එකෙ එල්ලුනෙමි.

ඉස්සරහින් එල්ලුන මම ඇතුලේ සිට මා දෙස බලා සිටින සුපුරුදු ඇස් දෙකක් දුටුවෙමි.

KUSHAN HETTIARACHCHI

සාගරිකා මම ඇය හා සිනාසුනෙමි .සාගරිකා යනු අපේ පංතියේ සිටි මගේ හොඳ යාලුවෙකි

"කුෂාන් එන්න ඇතුලට මෙතන ඉඩ තියනව. "

මම අමාරුවෙන් සෙනග අතරින් රිංගා ඇය වෙත ගියෙමි .

"කෝ බන් උඹෙ අඹ යාලුවා."

මම වටපිට බලමින් ඇයගෙන් ඇසුවෙමි .

"ශෂිකා අද එන්නෙ නෑ කුෂාන් එයාලගෙ ගමේ

දානයක් ඒක නෙවෙයි මොකද අද පැණිවරක ගහට හෙන ගහලද? "

"ඒ කිව්වෙ. "

අර යයි ඇය බසයේ පිටුපස ඇස් කොනෙන් පෙන්නුවාය .

"ඔව් නෙ මාව ආශ්‍රය කරන්න එපා කිව්වලුනෙ. "

"ආනේ ඒ මොකද ?"

සාගරිකා ඇසුවේ මුහුණටම එබීගෙනය .

"මම නරක ළමයෙක් ලු ඉතින් මං ආශ්‍රය කරණ අය නරක් වෙනවලු ."

"හරි විහිළු කතාවක් නෙ "

සාගරිකා පැවසුවේ සිනාසෙමින් ය .

හරියටම අටයි පනස් පහට අපි බෞද්ධාලෝකය ගාවින් බැස ගත්තෙමු .තව විනාඩි විස්සයි සුමිත් බංඩාර සර් ගේ ක්ලාස් එක හරියට නවයයි කාලට පටන් ගනියි.ඉක්මනින් ක්ලාස් එකට ගිය අපි අත් සෝදා කෑම කන්න උනෙමු .

ඩේවිඩ් නම් කියන්නෙ කාලා අත හේදුවාම එක පාරින් ඉවරයි කියලයි.

මේ වෙනකොට කොහොම හරි ඬේවිඩ් නිරාශාව ශේප් කරගෙන තිබුනි. ඒත් මටනම් ඇය උන්නෙ රවමින් ය

යකෝ හරි කෙලියක් නේ අහක ඉන්න මම දැන් මේ අහුවෙලා ඉන්නෙ හරි බලා ගමුකො නංගී.මම මටම මුමුනා ගතිමි .

බත් එක බාගයක් කන විට එතනට දුව ආවේ හර්ශයි කලුවයි කඩන් පනින හමුදාව වගේ බත් එක වසා ගත්තෝය ඉන් පසු බත් එකට උනදෙයක් පැවසීමට අනිත් අය අපොහොසත් විය .

"මචන් අද කේසිරි සර් එන්නෙ නෑලු. "

හර්ශ කීවේ සැමෝ දෙසම බලන ගමන් .

"ඒ කියන්නෙ අද රජපිහිල්ලෙ ඇඟිල්ලක් ගහන්න ඉඩ නැතිවෙයි. "

මම කීවේ ඩෙවිඩ් දෙස බලා ගෙනයි .

"ඔව් ඉතින් උඹල වගේ තනියෙන් කඩ දාන් ඉන්න උන්ට ඉරිසියයි නෙ. "

ඬේවිඩ් කිව්වෙ නෝන්ඩියට මෙනි .

KUSHAN HETTIARACHCHI

"මන් පස්සෙන් එන කෙල්ලො ගැන ඇහුවොත් උඹල ඉරිසියාවෙ පැලෙයි. "

මම ඉතින් මගෙ නම්බුව බේරගන්න පැවසුවෙමි .

"ඔව් ඔව් අපි ඒ ගැන මේ කෙල්ලො ගොඩේ කතා නොකර ඉමු නේද මස්සිනා ."

ඩේවිඩ් පැවසුවේ මගේ උරහිසට අතක් තබන ගමන් .

"ඒක නෙවෙයි කුෂෝ අපි දෙන්න එක්ක පාර්ක් එකට යමුද මම උඹට කන්න ටිපිටිප් එකකුයි බොන්න කෝක් එක කුයි බලන්න උඹ කැමතිම නවල් එකකුයි අරන් දෙන්නම්. "

ඩෙලා කිව්වෙ මගෙ මුහුණට එබී සිනාසෙමින් ය .

"හෑ උඹ මොකද ඔච්චර මට සලකන්නෙ. "

මම ඩේවිඩ් ගෙන් ඇසුවෙමි .

"අනේ මචෝ උඹ කලින් ගෙදර ගියොත් මම කපෝතියි නෙ මගෙ කාර් එක උඹලගෙ දිහානෙ."

"එහෙනම් ඒකයි මේ සත්ත කරුණාව .යකෝ උඹල ලව් කරන්න මම හප වෙන්න මට වැඩ තියනව බන්."

මම බොරු කෝපයක් මවාගෙන ඩේවිඩ් ට පැවසීමි.

සුමිත්සර් ගෙ ක්ලාස් ඉවර වී ඩේවිඩ් නිරාශා සහ මම රජ පිහිල්ල උද්‍යානයට ගියෙමු .

"යකෝ කේසිරි විතානගේ සර්ගෙ ක්ලාස් එකෙන් බාගයක් ම මෙහෙ නෙ ."

මම මටම පවසා ගතිමි.

ඩේවිඩ් සහ නිරාශා පාර්ක් එක ඇතුලට ගිය අතර මම ගේට්ටුව ගාවම සිමෙන්ති බංකුවේ වාඩි වූයෙමි .මම ඕක ඇතුලට ගිහින් එල්ලෙ ගහන්නද.උන් දෙන්න කරන මගුලක් කරන් එන්නෙ නැතැයි .මම බෑග් එකේ තිබුන වීඩියෝ ගේම් එක අරගෙන සෙල්ලම් කරන්න උනෙමි .

පාර්ක් එකේ කපල් මෙන්ම එක්ව ඇවිදින ගැහැණු ළමයි ද සිටියෝය. තමන්ගේ ඊලඟ ක්ලාස් එක පටන් ගන්නකම් බොහෝ අය පාර්ක් එකේ ගත කලෝය. මගේ දෑස නතර වූයේ ටිකක් එහායින් තණකොළ මත වාඩිවී සිටි මුස්ලිම් ගැහැනු ළමුන් තුන්දෙනා වෙතය. මොකද කහ පාට සල්වාර් එක

KUSHAN HETTIARACHCHI

ඇඳ සිටි කෙල්ල මාදෙස බලා සිට මම බලද්දී බිම බලාගත් නිසාය .ඇයගේ ඇස් පමණයි පෙනුනේ අනිත් සියලු දේ ෆර්දාවෙන් වැසී තිබුණි .

ඒකි බලන් හිටියට මට පාං ද මම යලිත් බිම බලන් ගේම් එක ගහන්න ගත්තෙමි.ඔය තංගච්චිල එක්ක යාලුවෙන්නද අනික මම දන්නෙ කොහොමද මම දිහා ද වෙන කොහෙ හරි බලන් හිටියද කියල .

මම මටම පවසා ගතිමි .

මම ඉදගෙන සිටිද්දීම ඔවුන් තිදෙනා මා ලඟින්ම පාර්ක් එකෙන් පිටවීමට ආවෝය. මම ඒත් ගනන් නොගත්තෙමි .

"අද කෙල්ල ඇවිත් නෑ වගේ එකනෙ තනියම ඉන්නෙ. "

මාව පාස් කරන් යන ගමන් එකියක් අනිත් උන්ට පවසා සිනා සුනෝය.

යකෝ මුන් කින්ඩිය දැම්මෙ මට නේද ?.යකෝ පාර්ක් එකට එන්න කෙල්ලක් ඉන්නම ඕනද ?

මම ඉතින් මට නෙවේ වගේ සිටියෙමි . කට ගහන්

ගිහින් ඉල්ලන් බාල්දි දාගන්න බෑ නේ .

ඒත් ගේට්ටුව ලඟදි යලිත් ඇය මාදෙස මොහොතකට හැරී බැලුවාය.ඒ ඇස් දෙක ඒ මොහොතේ මගේ ඇස් දෙකේ රැඳුනි ...
ඒ එක්කම වගේ ඩේවිඩුයි නිරාශයි ඈතින් එනු පෙනුනි.
"මොකද සනා කෙල්ලෙක් සෙට් උනේ නැද්ද? "
ඩේවිඩ් ඇසුවේ මගෙ උරහිසට තට්ටුවක් දමමිනි .
"නෑ බන් මෙතනට ඉතින් ඔක්කොම වගේ එන්නේ අයිතිකාරයො තියන එවානෙ. "
මම විඩියෝ ගේම් එක බෑග් එකට දාගෙන නැගිට්ටෙමි .එහෙත් අර ඵර්දාවෙන් වැසුනු දුඹුරු ඇස් දෙක මගෙ හිතේ කොනක තැම්පත් වේ තිබුනි.
අපි බස් ස්ටෑන්ඩ් එකට එන විට .ටෝනි අයියාගේ බසය නවත්තා තිබිනි .අපි වැඩි හරියක් ම ගියේ අජිත් අයියාගේ හෝ ටෝනි අයියාගේ බස් වලය .සීටීබී බස් වලින් ඒ බස් දෙක ඉතා වේගවත්ම බස්

දෙක වූයේය.

අපි බිහල්පොල හන්දියෙන් බසින විට හවස තුන හමාර පමණ වී තිබුනි .බසයෙන් බැස්ස ගමන් මම දුවගෙන ගියේ රංග අයියලාගේ පත්තර කඩය වන ජයසිරි ස්ටෝර්ස් වෙතය. ඒ ඉරිදා ලංකාදීපය ගැනීමටය .ඒ දවස් වල ඉරිදා පත්තර සෙනසුරාදා හවස ගැනීමට හැකිය .ගෙදර ආ පසු මද වේලාවකින් ඩේවිඩ් පිටත් වූයේ හෙට ඉරිදා විශේෂ නිවාඩු දවසක් නිමල් හෙට්ටිආරච්චි සර් ගේ පිසික්ස් ක්ලාස් එක පැවැත්වේන්නෙ නැති නිසා දහයට විතර අපේ දිහා එන බව පවසාය .

මම යලිත් නාගෙන ඇදට වැටුනේ ගෙන ආ පත්තරය බැලීමටය .මට පත්තරේ තියන කිසි දෙයකට හිත නොයයි ෆර්දාවෙන් වැසුනු දුඹුරු ඇස් දෙකම මතක් වේ ...

"පුතා පුතා "

මම ඇහැරුනේ අම්මාගේ කට හඬටය. රෑ අටටත් කිට්ටුයි මම මුහුණ කට සෝදා රෑ කෑම කෑවෙමි.අර සුන්දර ඇස් එක්ක සිහින ලොවක තනිවීමට

සිතෙයි .කව්ද ඇය ලබන සෙනසුරාදා ක්ලාස් කට් කර පාර්ක් එකට යනව ඊට සමහර විට ලබන සතියෙත් එයා ඒවි .මම පාඩම් නොකරම ඇඳට වැටුනෙමි .

*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*

"ට්‍රීන් ට්‍රීන් "

මම අවදි උනේ ඇද අසලම වූ දුරකථනය නාද වීමෙනි .

"හෙලෝ"

"හෙලෝ මම ඩේවිඩ් කතා කරන්නෙ. "

"මචන් කියපන්. "

"මට අද එන්න වෙන්නෙ නෑ බන් හදිස්සියේ ඉයේ රෑ ආච්චිල ආවා. "

"ඕකේ මචන් අපි එහෙනම් අඟහරුවාදා උදේ හම්බෙමු. "

ඉරිදාත් සඳුදාත් නිකම්ම ගෙවී ගියේය අඟහරුවාදා උදේන්ම ඩේවිඩ් අපේ දිහා ආවේ පාසැල් යන්නටය .එදින අපට විශේෂ දවසක් උනේ අලුතෙන් උසස් පෙළ පංති වලට ළමයින් බාර

ගන්න නිසාය .

උදේ අට වෙන විට නව දොලහ පංති වලට ඇතුලත් වෙන සිසු සිසුවියන් පැමිණ සිටියෙන් අපට එදින ඉගැන්වීමක් තිබුනේ නැත. මම නම් ශිෂ්‍ය නායකයෙක් නිසා එම වැඩ වලට නිල වශයෙන්ම එකතු උනි.

ඈත දීම මාව දුටු දෙලන සර් මට අත වනා අඬගැසුවේ නිසා මම ඒ දෙසට ගියෙමි .

"ගුඩ් මෝර්නින් සර් ."

"ගුඩ් මොර්නින්,කුෂාන් පරණ  දොලහ පන්ති වලටත් අද ළමයි කීපදෙනෙක් එනව ඩෙස් පුටු ටිකක් දම්මන්න වෙයි. "

"කී දෙනෙක් එනවද සර්. "

"අට දෙනෙක් විතර  බයෝ ක්ලාස් එකට දෙන්නයි අනිත් හය දෙනාම ආර්ට්ස් වලට. "

"එතකොට සර් මැත්ස් එකට කවුරුත් නැද්ද? "

"නෑ මැත්ස් එකට නෑ ඔයා ගිහින් අර වඩුවැඩ කාමරේ  පිටිපස්සෙ තියන ඩෙස්ක් පුටු වලින් හොඳ දෙකක් වෙන් කරල ළමයි කීපදෙනෙක් ට

කියල ඔයාලගෙ පංතියට දා ගන්නකො."

"එතකොට සර් ආර්ට්ස් එකට එන හය දෙනාට."

"ඒ වැඩේ මම නුවණ් ට කිව්ව. "

මම අටවසරෙ පොඩි කොල්ලො ටිකක් අල්ලන් ඩෙස්ක් දෙකක් සහ පුටු දෙකක් අපේ පංතියට දැම්මෙමි .

"ඒ අපේ පංතියටත් අලුතින් එනවද බන්. "

එසේ ඇසුවේ ඉන්දිකය.

"ඔව් බන් කලූ."

"කෙල්ලොද කොල්ලොද? "

"මන්ද බන් තව ටිකකින් බලා ගන්න පුලුවන්. "

"ඔව් ඔව් හොඳ රැග් එකක් දෙන්න පුලුවන්. "

"මේ මේ මචන් මේක කැම්පස් එකක් නෙවේ ඉස්කෝලයක් ඇරත් මම ඔය රැග් වලට විරුද්දයි උඹ ඒක දන්නවනේ."

"හ්ම්ම්. "

කලුවා ඔහුගේ පුටුවෙන් ඉද ගනිද්දී දෙලන සර් ගැහැණු ළමුන් දෙදෙනෙක් සමග අපගේ පන්තියට ඇතුලු විය.

සරායා
KUSHAN HETTIARACHCHI

එක්කනෙක් මුස්ලිම් ගැහැණු ළමයෙකි අද ෆර්දාවෙන් මුහුණ ආවරණය වෙල තිබ්බත් මට ඒ ඇස් දෙක අඳුන ගන්න අපහසු උනේ නැහැ .ඒ ඇස් දෙක මා දෙස බලා විශ්මයෙන් ඇලලී යනු මම හොඳටම දුටිමි .

මම හොය හොය හිටිය ඇස් දෙක ඔය ළඟටම ගෙනත් දීල තියෙන්නෙ ..ගැහැනුළමුන් දෙදෙනා පිටුපස පේලියේ තැබූ ඩෙස් පුටු වල වාඩි වූ පසු දෙලන සර් පන්තියෙන් නික්ම ගියේ අලුත් ළමයින් බාර ගැනීමට තිබූ රැස් වීම ප්‍රධාන ශාලාවේ මේ වන විටත් පැවැත්වෙමින් තිබූ බැවිනි. අනිත් ගැහැනු ළමයා හදුනන ගැහැනු ළමුන් පංතියේ සිටි බව දැනුනේ ඈය පංතියේ කෙල්ලන් සමග කතා බහ කරමින් සිටි විදිහටයි .නමුත් මුස්ලිම් කෙල්ල බිම බලාගෙන සිටියේ ඇය මේ පරිසරයට ආගන්තුක නිසා වෙන්නට ඇත .මම අසල තිබූ පුටුවක් ඇද ළඟට ගෙන එහි ඇන්ද පැත්ත ඉස්සරහට තිබෙන ලෙස තබා ඇයගේ ඩෙස් එක ඉදිරියේ වාඩි වූයෙමි .එවිටම ඩේවිඩ් හර්ශ ඉන්දික

සරාගී
KUSHAN HETTIARACHCHI

තුන්දෙනාම ලඟට අවෝය .

"මොකදබ බන් මෙයා කියන්නෙ. "

"මොකවත් කියන්න මම මොකවත් ඇහුවෙ නෑනෙ. "

"එහෙනම් අපි අහමු. "

හර්ශය මගෙ උරහිසට හේත්තු විය

"දෙයියන්ගෙ නාමෙට උඹල පැත්තකට පලයල්ල මට මෙයා එක්ක පොඩි ඇරියස් එකක් තියනව බේර ගන්න. "

මම ටිකක් කෝපයෙන් කීවෙමි.

"ඕහ් කම්මුල් පාරක්වත් කාල වගේ අපටත් හොරෙන් හරි හරි බේර ගනින් කො අපි කැන්ටිමට යනව. "

කියමින්ම ඩේවිඩ් ඉන්දිකයයි හර්ශයයි එක්ක පංතියෙන් එලියට ගියෝය .උගන්නනෙ නැති නිසා ඔක්කම එවුන් එලියේය. පන්තියේ ඉතුරු වූයේ ඇයත් මමත් පන්තියේ පොත් ගුල්ලා මදුරංගත් ය. උඟ හිටියත් නෑ වගේ නිසා කමක් නැත .

තාමත් මේ කෙල්ල බිම බලාගෙන පවු බයේ

සරායා
KUSHAN HETTIARACHCHI

ඇත්තෙ මුන් වැඩිය කොල්ලො එක්ක ආශ්‍රයක් නෑනෙ .

"මොකක්ද නම. "

මම ඇසුවෙමි.

ඒ ලස්සන දුඹුරු ඇස් දෙක එක එල්ලේ මාදෙසට එසවිනි මාගේ පපුවේ සිහින් ගැස්මක් ද ඇතිඋනි.

දෙයියනේ දුඹුරු ඇස් කඳුලු වලින් පිරිලාය.

"ඇයි නමක් නැද්ද? "

මම යලිත් ඇසුවෙමි.

"ස - රා - යා. "

ඇය වෙව්ලන දෙතොලින් පැවසුවාය පව් කෙල්ල හොඳටම බය වෙලාය එදා පාර්ක් එකේ තිබ්බ කට අද වැසිලාය.

"සරායා විතරද වෙන කෑ ල්ලක් නැද්ද? "

"ෆාතිමා සරායා මොහොමඩ්."

"මන් සරායා කියල කතා කරන්නම් කමක් නැද්ද?"

ඇය හිස වැනුවාය.

"ඇයි ඔයා එදා පාර්ක් එකේ දි මම දිහා බලන් හිටියෙ මම දැක්ක ,ඇයි කෙල්ල ඇවිත් නැතුව ඇති

කියල මට කින්ඩියක් දාගෙන ගියේ. "

"ඒ ඔක්කොටම උත්තර දැන් ඕනෙද අප්පා. "

"ඔව් මම ඔයාව කලින් දන්නෙ නෑ නේ. "

"ඒත් අපි ඔයාව දන්නව. "

"ඒ කොහොමද? "

"ඔයා හිමරෝස පත්තරේට ලියනව නේද? "

(මම පාසැල් කාලයේම විවිද පුවත්පත් වලට ලිව්වෙමි )

"ඔව් ඒත් ..."

"ඒත් මේත් නෙවෙයි ඔයා ලියන කතා අරි ජනප්‍රියයි,අපේ කෙල්ලො පිස්සුවෙන් ඒවා කියවන්නෙ. "

"එහෙමද?"

"ඔව් මගෙ යාලුව සබ්‍රිනා ඔයාව පෙන්නල එදා කිව්ව අර කොල්ල තමයි හිමරෝස පත්තරේට "අමාවකට ශඳ පායලා " නව කතාව ලියන්නෙ කියල. ඉතින් ඒකයි ඔයා දිහා කීප සැරයක් බැලුවෙ. "

"අපෝ එහෙමද මම හිතුව මන් ලස්සන හින්ද

සරාගා
KUSHAN HETTIARACHCHI

බැලුව කියල ."

"අනේ යන්න අප්පා විහිලු නොකර ඔයා ඉතින් කොහොමත් ලශ්ශනයි නෙ ."

"ඉතින් හිතන් ඉන්නෙ මම කෙල්ලො බර ගානක් තියන් ඉන්න කොල්ලෙක් කියලද ආ "

මම ඇසුවේ සරායාගේ ඇස් දෙක දිහා කෙලින් බලාගෙනයි .

"නෑ ඉතින් ඔයාට නැති වෙන්න බැනෙ සබ්‍රි ඔයා ගැන ගොඩක් දන්නව. "

"මොනවද දන්නෙ. "

"එයාගෙ අයියා ඔයාගෙ යාලුවලු ඔයාලගෙ ජිම් එකේ එයා නියාස් කියල. "

"අප්පා නියාස් අයියගෙ නංගිද? "

"හ්ම්ම්. "

"හරි අද ඉදල මම ඔයාගෙ යාලුව ෆ්‍රෙන්ඩ්ස්. "

මම මගෙ සුරත ඇයට දික් කලෙමි. ඇය මගෙ සුරත ලාවට අල්ලා සෙලවූයේ ලැජ්ජාවෙනි.

"ඔයාට අද ඉදල ඕන තරම් මම දිහා බලන් ඉන්න පුලුවන්. "

සරායා Author KUSHAN HETTIARACHCHI

මම ඇගේ ඇස් දෙස යලිත් කෙලින් බලා පැවසුවෙමි .

"අනේ අපි පිරිමි ළමයි එක්ක වැඩිය නෑනේ. "

ඔන්න ඔහොමයි සරායගෙයි මගෙයි යාලුකම පටන් ගත්තේ ..

මම යාලුවෙක් විදිහට ලඟින්ම ඇයව තියා ගත් නිසා පංතියේ අනිත් අය සමග ඇය වැඩි ඇසුරකට නොගියාය .මෙලෙස මාසයක් පමණ ගත විය මම නිසා සරායා ට කවුරුත් රැග් කිරීමටවත් මුකුත් කීමටවත් ආවේ නැත .සරායා නිසා මගේ දඩබ්බර වැඩ ටික ටික අඩුවිය .දවසක් හිස් පීරියඩ් එකක මමයි සරායයි කතා කරමින් සිටියෙමු .

"කුෂාන් ඔයා හැමෝටම නිසදැස් ලියනව බැරිද මටත් එකක් ලියන්න. "

ඇය පැවසුවේ මගෙ ඇස් දෙස එක එල්ලේ බලාගෙනය

"කෝ දෙන්න පොත. "

මම පැවසුවේ මගේ සුරත ඇය දෙසසට පාමිනි .

මම ඇගේ පොතේ අවසාන පිටුවේ ලිව්වෙමි.

ෆර්ධාවෙන් වැසුනු සඳවතිය .

සඳලුතලේ සිට

දුඹුරු නෙත් විදහා

මා දෙස බලා

කෝල ලෙස සිනා පා

හදවතේ මා

සිරකර ගත්තාය

සරායා Author KUSHAN HETTIARACHCHI

මම එය ඇය අතට දුනිමි තරු නෙත් විදහා ඇය එය කිය වූයේ...

"අම්මෝ කියල තියන බොරු මම කවුරුත් හිර කර අත්තෙ නෑ ඕන්. "

"නෑ හිරකර ගත්ත. "

"ඇත්තට ඔයාට කොහෙන්ද මේ අදහස් එන්නෙ. "

ඇය ඇසුවේ මුවට සිනහවක් නගාගෙනය

"ඒව එන්නෙ ස්වර්ගෙ ඉඳල. "

"ආ ඔයා අපේ අල්ලගෙ දේව දූතයෙක් ද? "

"එහෙමද පේන්නෙ. "

"නෑ අනේ මන් නිකන් කිව්වෙ. "

"ඒක නෙවෙයි සරා මම දෙයක් කියන්න හිටියෙ. "

"කියන්න  කුෂාන්."

"අපි ලයිබරියට යමුද යන ගමන් කියන්නම් මම. "

අපදෙදෙනා ලයිබරියට ගියෙමු. මේ දවස් වල නිවාසාන්තර ක්‍රීඩා නිසා වැඩි ඉගැන්මක් තිබුනේම නැත .

"මොකක්ද කුෂාන් කියන්න තියෙන්නෙ. "

ෆිසික්ස් ලැබ් එක ලගින් ප්‍රාතමික අංශයට පිවිසෙන හරියේදී ඇය විමසුවාය.සරඹ පුරුදු කරණ නිසා ප්‍රාතමික අංශයේ කවුරුත් නොවූහ .

"මේකයි සරා මම හිතන්නෙ මම ඔයාට ආදරේ කරනව. මට මේක තවත් හංගන් ඉන්න බැහැ. "

"මො-න-වා  කුෂාන් ඔයා මේක හොඳට හිතලද තීරණය කලේ අපි ආගම් දෙකක මේක කවදාවත් වෙන දෙයක් නෙවෙයි. ඔයා විතරක් නෙවෙයි මමත් ඔයාට කැමතියි. "

"මේකයි සුදු ඉස්සරලම ඔයා කැමතිද

KUSHAN HETTIARACHCHI

කියන්නකො. "

මම ඇයගේ සුරතින් අල්ලා අසල වූ පුටුවක ඉන්දුවෙමි.

"අපිට ගොඩක් ප්‍රශ්න එයි මම කොහොමද හැම වෙලාවෙම හිනා වෙලා ඉන්න ඔයාගෙ ඇස් වලට කඳුලක් දෙන්නෙ මාව පොඩි කාලෙම මගෙ මස්සිනාට ප්‍රපෝස් කරල තියෙන්නෙ එයා ඉන්නෙත් මම විභාගෙ කරනකම් මාව මැරි කරන්න. අනික මුස්ලිම් කෙල්ලෙක් ට විවාහය ගැන එහෙම තීරණ ගන්න බැහැ ආගමෙන් පිට කෙනෙක් ගැන හිතන්නවත් බැහැ. "

"මට ඔය බයිලා වලින් වැඩක් නෑ සරා ඔයාගෙ හිතේ පොඩ්ඩක් හරි ඉඩක් තියනවනම් මට ඔයා තීරණේ දෙන්න මට ඉතිරි හැම දේම මම බලා ගන්නම්. "

මේ සුදු මුස්ලිම් කෙල්ල නැතිකර ගැනීමේ කිසිදු උවමනාවක් මට නොවිනි.

"මම දෙන්නටම හරියන වැඩක් කියන්නම්. "

සරා යලි කටහඬ අවදි කලාය.

"මොකක්ද සරා "

"කුෂාන් මේ ගැන මට ටිකක් හිතන්න ඕන මම ඔයාගෙ අතින් අල්ල ගන්නවනම් ඒ කවදාවත් අතහරින්න බලන් නෙවෙයි. "

"මට තේරෙනව ඔයා ටිකක් හිතල මට උත්තරයක් දෙන්න මම දන්නව මේක ටිකක් අමාරු ප්‍රශ්නයක් ඒත් ඔයා කැමැත්ත දුන්නොත් මට අනිත් දේවල් විසඳන්න පුලුවන්. "

එදින අප දෙදෙනා අතර හවස පාසැල් නිම වෙනකම් යලි කතා බහක් නොවිනි පංතිය තුලදී ද ඇය කල්පනාවේ නිගමන් වී සිටි අයුරු මම දුටුවෙමි.මම සිතනවාට වඩා ඇය මේ ගැන සිතනබව නම් පෙනිනි .පාසල ඇරුණු පසු වෙනදා මෙන්ම සරායා බස් එකට නගින තෙක් ඇයත් මමත් බස් හෝල්ට් එකේ කතා කරමින් සිටියෙමු .බස් එක ආපසු ඇය එයට ගොඩ වූයේ මට වේව් එකක් දමමිනි .මමත් ඩේවිඩුත් ගෙදර ඒමට පිටත් උනෙමි.

"මොකද කිරිල්ලි කියන්නෙ. "

ඩේවිඩ් අසද්දී.

"නාම මොකුත් කිව්වෙ නෑ බන් හෙට කියයි. "

එදින ගෙදර ගොස් නාගෙන පොතක් බලන්න ගත් නමුත් පොත බැලීමට සිත එකඟ කර ගැනීමට නොහැකිවිය.සිහියට එන්නේම සරායාගේ දුඹුරු ඇස් දෙකමයි අන්තිමට මම නිදාගෙන තිබුනේ රෑටත් නොකාමයි .මට නින්ද ගිය පසු කවුරුවත් මාව ඇහැරවන්නේ නැත්තේ .මම නින්ද ගියොත් ඇහැරෙන්නේ නැති නිසාය .

*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-

පසුදා උදෑසන නැගිට පැයක් පමණ පාඩම් කලෙමි .ඉන්පසු පාසැල් යන්න ලෑස්ති වනවිට ඩේවිඩ් ආවේ ඔහුගේ මල්ලි ඩැනියලුත් සමගය .ඩැනියල් වැඩි කතාබහක් නැති අතර අප සමග පිස්සු වැඩ වලට එක් උනේ නැත .අප තුන්දෙනා පාසැල් යන්න පිටත් වූ නමුත් මමවත් ඩේවිඩ් වත් සරායා ගැන කතා නොකලේ ඩැනියල් සිටි නිසාය .

පාසලට ආ පසු මගෙ දෑස සෙව්වේ සරායායි.

"මචන් ඩෙලා සරා නෑනේ බන් වෙනද අපි එද්දි

ඇවිත් නෙ. "

"ඒකි අද එන්නෙ නැතිවෙයි" ඩේවිඩ් කිව්වෙ ගනනකටවත් නොගෙනය.

"කියපං මොකක්ද මේ කුමන්ත්‍රණය. "

මම මදක් කෝපයෙන් ඔහුගෙන් ඇසුවෙමි .

"ආහ් ඔකට කේන්ති ගන්න එපා මිත්‍රයා ඒකි විතරක් නෙවෙ ඒ පැත්තෙන් එන කිසි කෙනෙක් අද එන්නෙ නෑ. "

"ඒ මොකද බන්?"

"කැකුණගොල්ල බස් එක කැඩිල බන් උදේ ස්ටාර්ට් නෑලු සමහර විට බස් එකක් දැන් දාලනම් සරා ලේට් වෙලා ඒවි. "

"බම්බුව ඔය බස් එකටත් අදමද කැඩෙන්න ඕනේ. "

මම ලඟ තිබූ ඩෙස්ක් එකට අත මිට මොලවා වැරෙන් පහරක් ගැසීමි .

"යකෝ සිලෝන් ටකරං බස් එහෙම තමයි නඩත්තු නෑ දුවනව විතරනෙ උඹ ඔකට අත කඩා ගත්තම හරියන්නෙ නෑ නේ. "

එවිටම වාගේ ඈතින් එන ළමයි ටික ඩේවිඩ් පෙන්නුවේය.

"අන්න උඹේ සූකිරි කැටේ එනවා බලපන් කො පැණි හිනාව. "

සරායා අප දෙසට ආවේ සිනාසීගෙනය .

"බස් එක කැඩිලනෙ මෙයා අලුත් එකක් පාරට දාන්න වූ ලේට් උනා. "

ඇය එසේ කියමින් ඇයගේ ඩෙස්ක් එක මතපොත් ටික තැබුවාය .

ඇයගෙන් විහිදුන විලවුන් සුවද මගේ නාසයට හොදට දැනුනි.

"මේ මචන් මම ග්‍රවුන්ඩ් එකට යනව අනිත් උනුත් ග්‍රවුන්ඩ් එකේ නේ උඹ ඔකි එක්ක ඕන මරාලයක් කර ගනින් මරන්න වගේ එනවනම් ග්‍රවුන්ඩ් එකට දුවන් වරෙන්. "

ඩෙලා මගෙ පිටට තට්ටුවක් දමා පඩිපෙල බැස පිට්ටනිය දෙසට ගියේය .අපගේ පංතිය තිබුනේ උඩ තට්ටුවේය .අනිත් පංති හතරෙත් ළමුන් කීප දෙනෙක් සිටියෝය .අපේ පන්තියේ සිටියේ මමත්

සරායා
Author
KUSHAN HETTIARACHCHI

සරායත් පමණි .

"ඉතින් කුෂි "

සරායා මාදෙස බලාගෙන පැවසුවාය.

"ඔව් සරා කියන්න. "

"ඔයා ඉල්ලපු දේ මට දෙන්න බැහැ කුෂාන් මම ඊයේ රෑ පුරාවටම මේ ගැන හිතුව. "

මගෙ පපුව වේගයෙන් ගැහෙන්න විය දෑසට පිරුණු කදුලු එලියට නොදා ඉන්න මම ෆුල් ට්‍රියි එකක් දුන්නෙමි .

"කමක් නෑ සරා මම ගොඩක් හෝප්ස් තියන් හිටිය මේ මොහොත වෙනකම් ඒත් අපේ යාලුකම හැමදාමත් එහෙම්මමයි සතුටින් ඉන්න හැමදාමත් "ෆ්‍රෙන්ඩ්ස් " "

මම ඇයට වෙනදා මෙන් මගේ සුරත දිගු කලෙමි .

මගේ සුරත අල්ලගත් ඇය.

"ඔයා හිතනවද මම මේ ඔයාගෙ අත අල්ල ගත්තේ ආයේ අත හරින්න කියල මම ඔයාට ආදරේ කරනව එකක් මතක තියා ගන්න මුස්ලිම් කෙල්ලෙක් ආදරේ කරන්නෙ එක පාරයි ආයේ අත

හරින්න බලන් නෙවෙයි. මම ඔයාට හුඟක් ආදරේ කරනව කුෂාන් ."

මගේ දෑස් විශාල විය සිතට දැනුන සතුට කියා නිමක් නැත .මෙයත් මාර වැඩනෙ කරන්නෙ.

"ඔය ඇත්තමද සරා අයි ලව් යූ සෝ මච් මම මැරුනත් ඔයාව අත හරින්නෙ නෑ. "

"හැබැයි බබා අපිදෙන්නට හුඟක් ප්‍රශ්න ඒවි ඒ හැමදෙයක්ම අපි දෙන්නට තමයි විසඳන්න වෙන්නෙ. "

"මම කිව්වනේ මට ඔයාගෙ කැමැත්ත දෙන්න ඉතිරි ප්‍රශ්න මම බලා ගන්නම් කියල. "

"එහෙනම් අපි දෙන්න කැන්ටිමට ගිහිල්ල මේක සෙලිබ්‍රේට් කරන්න ඕනේ. "

ඇය කීවේ සුරතල් ලෙස සිනාසෙමිනි .

"මොකක්ද අපි සෙලිබ්‍රේට් කරන්නෙ. "

මම ඇසුවේ සිනාසෙමිනි

"ඔයා තම්බි කෙල්ලෙකුට අහු උන එක මිසක් වෙන මොකක්ද? "

සරා කීවේ ඇස් ලොකු කර සිනාසෙමිනි ඒ මදිවට

එක අතකින් මුවත් වසාගෙනය මම කැමති ඇගේ මේ ඉරියවු වලටයි.

"තම්බි කෙල්ල?? "

මම එයම කියද්දී.

"අපි නැති තැනදි අපට ඔහොමනෙ කියන්නෙ තම්බිච්චි තංගච්චී ,මම දන්නවනෙ ඉතින්. "

තාමත් ඒ දෙතොලේ සිනාව රැඳී ඇත .

"එහෙනම් මගේ ප්‍රියම්භිකාව අප බොජුන් හල වෙත යමුද? "

මම නාට්‍යානුසාරයෙන් පවසද්දී

"මොකක්." සරායා පැවසුවේ හඬනගා සිනාසෙමිනි .

මා පැවසූ ලෙස ඇයට සිනහව නවතා ගන්න බැරි විය .

අප දෙදෙනා පංතියෙන් එලියට යන්න හදදී පංතියට  ආව කෙනා දැක අප දෙදෙනාගේ මුහුණෙන් මුහුණ බැලුනේ එකවරමය.

ඒ වෙන කවුරුත් නෙවෙයි අපේ පංතියේ චීත්තේ , රන්ජනුයි.

KUSHAN HETTIARACHCHI

අපි ඔහුව ගනන් නොගෙන එලියට ආවෙමු .
"අද ලිඳ ලඟ සංගමේ වගේ පදයක් හදයි ද දන්නෙ නෑ. "
සරා පැවසුවේ මගේ මුහුණට එබීගෙනය .
"කවුරු මොනව කිව්වත් ඔයයි මායි හරියට ඉන්නවනම් එච්චරයි සරා ,ඔයා දන්නවද ඕකා කියල තියනව සරායව යාලු කරගන්නව කියල. "
"මොනව මාව ඔය කලු කොටා එක්ක මම වචන දහයක් වත් කතා කරල නෑ. "
"මොනව ඇයි ඒ? "
මම පොඩි එකෙක් වගේ ඇගෙන් ඇසුවෙමි .
"එක්කෙනෙක් මම මෙහෙ ආපු දා ඉඳල මාව ඇස් දෙකෙන් අල්ලල තියාගෙනනෙ හිටියේ. "
"කව්ද අප්පා මම නම් නෙවෙයි ඕන්. "
මම කීවෙමි .ඒ වන විට අප පල්ලෙහා විලෝ ගස් අතරට ඇවිත් සිටියෙමු .
ඒ හරියේ කවුරුත් වැඩිය ගැවසෙන්නෙ නැති නිසා පාලු ගතියක් ඉසිලීය .
"මෙන්න මෙයා. "

සරායා මගෙ නාසය වැරෙන් මිරිකා කැන්ටිම දෙසට  දිව ගියාය.හම්මෝ මේ පිස්සු බෝලෙ කරන වැඩ මේකේ ඉන්න මොකෙක් හරි දැක්කනම් ශිෂ්‍යනායක පට්ටමටත් කෙල වෙනව .

මමත් ඇය පසුපසින් කැන්ටිමට දිව ගියෙමි ...

"මොනවද කන්නේ. "

සරායා හති අරිමින් අහද්දි.

"අලි ස්පන්ච් එක්ක නෙක්ටො. "

"ශී මොනවද අප්පා ඒ ඔයා පොඩි එකෙක් ද අනික මෙච්චර සතුටු දවසක මට ස්පන්චිද දෙන්නෙ. "

"මගෙ ආස දේවල් වලට ඉතින් ඔයත් ආසා වෙන්න ඕනනේ. "

මම ඇගේ ලස්සන දුඹුරු ඇස් දෙස බලා පැවසීමි.

"මාත් ඉඳල ඉඳල අහු උනේ හොඳ කෙනාට තමයි. "

"ඇයි සුදු මම ශෝයි නැද්ද? "

"ශෝයි ශෝයි එහෙනම් ගන්නකො ඔයාගෙ අලි ස්පන්චියි නෙක්ටොයි. "

මම අලි ස්පන්ච් දෙකකුයි නෙක්ටො බඩී දෙකකුයි ගෙන සරායා හිඳගෙන උන් තැනට ගියෙමි.

KUSHAN HETTIARACHCHI

ස්පන්චි ය කන්න ගත්තා විතරයි.
කොහේදෝ සිට දිව ආ ඩේවිඩුයි හර්ශයි නුවණුයි අප දෙදෙනා වටකර ගත්තෝය .
"හනිමූන් කපල් එක තනියම පාර්ටී දානවා නේද? "
ඒ හර්ශයාගේ බෝක්කු කටයි.
"මොන කපල් එක කිව්ව."
මට ස්පන්චි කෑල්ලක් ඉස්මොල්ලේ ගියේය .
"ඊයේ ඇහුව අද හා කිව්වෙ නැත්තන් උඹල දෙන්න මෙහෙම ඉන්නවද නෑනේ. "
ඒ ඩේවිඩ් ය .
කොහොම හරි උන් එතනින් ගියේ මගෙ ස්පන්චියටයි නෙක්ටො බොතලේටයි ගේම දීමෙන් පසුවය .ඇත්තටම උඹල වගේ පාප මිත්‍රයෝ.
"සරා මුං ටික අපේ වෙඩින් එකට ආවාම අපිදෙන්නවත් ගිලිනව ශුවර්. "
මම කිව්වේ ඈත යන ඩේවිඩ් ල දෙස බලාය.
"අපට වෙඩින් එකක් ගන්න පුලුවන් වේවිද කුෂී ,"
මා දෙස මදක් වෙලා බලා සිටි සරා යලිත් කටහඬ

අවදි කලාය .

"කුෂාන් මට කියන්න ඔයා මං වගේම එක හිතින් මාත් එක්ක හැමදාම ඉන්නව නේද? "

සරා මට ලංවී ඇසුවාය.

"සරා මම ඔයාට ආදරෙයි කිව්වෙ විහිලුවට නෙවෙයි මැරෙන තුරාවට මම ඔයාව අතහරින්නෙ නෑ. "

"අපට වෙඩින් නම් ගන්න බැරිවේවි කුෂාන්. "

"මට ජාති ආගම් කුල මල ප්‍රශ්නයක් නෙවෙයි සරා මට උනත් ගෙදරින් ප්‍රශ්න එනව මුස්ලිම් කෙල්ලක් මැරිකරනව කිව්වාම හොදම දේ අපි ඔච්චව පටල ගන්නෙ නැතුව මේක කරමු ඔයා ඔයාගෙ ආගම අදහන්න මම මගෙ ආගම අදහන්නම් ආදරේ කියන දේ විතරක් අපේ හිත් වල අවංකවම තියා ගමු එන ඕනම දේකට අපි මුහුණ දෙමු. "

සරා අහිංසක ලෙස හිනා උනේ මගෙ දෑස් දෙස බලාගෙනයි.

"යමු කුෂාන් පංතියට හෙට ක්ලාස් එනව නේද? "

"ඔව් මැරුණෙ නැත්තම් එනව සරා. "

"ඔය මම කියල තියනව නේද ඔය මැරෙණ කතා කියන්න එපා කියල. "

සරා මගේ කටට හිමින් පහරක් ගැසුවාය .

"බූරුවා. "

ඇය ගස්සන් පන්තිය දෙසට ගියාය.

හුටා දැන් ඉතින් මේකිව නලවන්න වෙනව ශුවර්.

මමත් ඈ පසුපසින් පන්තිය වෙත ගියෙමි .

"සරා .."

මම පන්තිය ලඟදී මට ඉදිරියෙන් ගිය සරායාට කතා කලෙමි

"මොකද? "

ඇය සැරෙන් අසා මා දෙසට හැරුනාය.

දෙයියනේ ඒ ඇස් වල කඳුලු .

"සරා මොකද මේ ඇස් වල කඳුලු. "

මා දෙසට පියවරක් ආපසු ආ ඇය මට දබර ඇඟිල්ල දිගු කොට.

"මාව අඬවල ඇයි කඳුලු කියල අහනව අදින් පස්සෙ ඔයාට මැරෙන්නවත් අයිතියක් නෑ මම නැතුව තේරුනාද? "

සරාගෙ Author KUSHAN HETTIARACHCHI

ඇය තවත් පියවරක් ඉදිරියට අවේ එසේ පවසාගෙනයි .

"ඔයාට කලින් මමයි මැරෙන්නෙ මට ඔයා නැතුව මොහොතක් වත් ඉන්න බෑ දැන්.ඔයා දැනගන්න මුස්ලිම් කෙල්ලෙක් කවදාවත් බොරුවට ආදරේ කරන්නෙ නෑ .දැන් ඔයා මගෙ විතරමයි. "

කියමින් ඇය මාව වැලඳ ගත්තාය .

මම ඇගේ ඒ ක්‍රියාවෙන් ව්‍යාකූල උනෙමි.

"සරා මේ ඉස්කෝලේ, කවුරු හරි දැක්කොත් අපි දෙන්නටම හොඳ නෑ. "

මම ඇයව අසල වූ පුටුවෙන් ඉන්දුවෙමි.

"ඔයා ආයේ මැරෙන කතා කියන්න එපා. "

සරා පැවසුවේ හැඬුම්බරවය.

"මම ආයේ කියන්නෙ නෑ. "

"ඔයා දවසක අපේ ගෙදර එන්න. "

සරා එක පාරටම පැවසුවාය.

"අම්මෝ ඔයගේ තාත්තයි අයියයි මට ගහයි. "

"පිස්සුද අනේ එයාල දන්නෙ නෑ නෙ ඔයා කවුද කියල මම කියන්නෙ ක්ලාස් එකෙ ෆ්රෙන්ඩ්

KUSHAN HETTIARACHCHI

කියලනෙ. "

ඒ සමගම පාසල ඇරෙන සීනුව නාදවිය .

සියල්ලෝම පන්තියට ආවෝය .

රංජන් මා දෙසත් සරායා දෙසත් අමුතු විදිහට කීප සැරයක් බැලුවේය . මම ඔහුව ගනන් නොගෙන සිටියෙමි .

අපි පාසල ඇරී බස් හෝල්ට් එකට එන ගමන් කතා උනේ රංජන් බලන් සිටි අයුරුයි.

ටික වේලාවකින් බසයක් ආවේන් සරායා බසයට නැගුනේ හෙට බයෝ ක්ලාස් එකේදී හමුවෙමු යයි පවසමිනි .

මම ඇය ගිය බසය දෙස බලා සිටිද්දී පිටුපසින් ආ ඩේවිඩ් .මගේ පිටට තට්ටු කරමින්

"දැන් යමු නේද කිරිල්ලි ගියානේ " පැවසීය.

ඩේවිඩ් පැවසුවේ ඈතින් එන සනතුත් සාගරිකාත් දෙස බලාගෙනය .

සනත් යනු මැත්ස් එකේ සිටි අපේ යාලුවෙකි.

"අපේ සාගරික සනා එක්ක සෙට් ද? "

ඒසේ ඇසුවේ අප දෙදෙනා පිටුපසින් ආ හර්ශය.

Author KUSHAN HETTIARACHCHI

"ඔව් බන් දැන් මාස දෙක තුනක්. "

ඒ ඩේවිඩ් ය .

"යන් යන් බං අනුන්ගෙ ප්‍රේම ගීත වලට තනු දාන්නෙ නැතිව කලුවා ඉස්සර උනි. "

"ඒක නෙවෙයි බන් සරා කිව්වනෙ දවසක එයාලගෙ ගෙදර එන්න කියල. "

මම කියද්දී.

"මොනව.?"

ඉස්සර උන කලුවා ආපසු හැරුනි මා දෙස බලාගෙන ම.

"අම්මටයි තාත්තටයි බෑනව හඳුන්වලා දෙන්න වෙන්න ඇති. "

ඔහු කීවේ සිනා සීගෙනය .

"ඇයි අයියෙකුත් ඉන්නව. "

මම කීවේ ඔව්න් දෙස බලමිනි.

"එහෙනම් උඹෙ මහලොකු අලි ස්පන්චි හතරකුත් උස්සන් යමු වෙලාවක අලි ස්පන්චි බෑනව ඉහලින් පිලිගනියි. "

ඩේවිඩ් කියද්දී.

"මොන කෑමද බන් අලි ස්පන්චි මට  නම් පේන්න බෑ. "

කලුවා කීවේ හර්ශගේ කරට අතක් දා ගනිමිනි.

"උඹලට ඉතින් දේශීය කෑමක අගයක් නෑනේ නිකන් දුන්නොත් තියලම තියයි.  "

මම කීවේ නෝක්කඩු මූනක් මවාගෙනය.

අපි කතාවෙන් කතාවෙන් පයින්ම ගෙදරටම ආවෙමු .

සරායා
Author
KUSHAN HETTIARACHCHI

++++++

හිමි නැති බව දැන දැන
හිමි කර ගන්නට
පෙරුම් පුරනා
සොඳුරු ආදරය
ජීවිතේ සුන්දරයි කියමින්
පාසැල් ගිය සොඳුරු අවදිය
හිරු අවරේ ගිලුන පසු
පෙරදිග අඹරේ පායනකම් බලා සිටි
ඒ අතීතය

ඔබත් එක්ක අත්වැල් බැඳ යන්නට

පෙරුම් පිරූ ඒ සමනළ මාවත

මා දමා ඔබ ගිය අපූරුව ...

ඊර්ෂ්‍යාවෙන් වැසුන රෝස කුසුමියේ

දුර සිට බලමි ඔබ දෙස

සිතේ ආදරය පුරවගෙන

සරායා ආත්මීය නවකතාවෙනි

කුෂාන් කුෂී^

පසුදා උදේ වෙනදා වගේ කුරුණෑගල පංති ගියෙමු. ඉරිදා වත්හිමියේ නිමල් හෙට්ටිආරච්චි සර් ගේ පංතියට ඩේවිඩ් ආවේ නැත්තේ ඩේවිඩ් ලගෙ පල්ලියේ උත්සවයක් තිබුන නිසාය. එනිසා මම තනියම පංති ගියෙමි .මම පංතියට ගොස් වට පිට බැලුවේ සරා ඇවිත් ද කියායි .

එවිටම වගේ කව්දෝ මට පිටුපසින් තට්ටුවක් දැමූ නිසා මම ආපසු හැරී බැලුවෙමි .

ශෝක් ලස්සන මුස්ලිම් කෙල්ලො දෙන්නෙක් මා ඉදිරියේ සිනා සෙමින් සිටියෝය .

KUSHAN HETTIARACHCHI

"ඔයා නේද කුෂාන් කියන්නෙ. "

"ඔව් මම තමයි. "

"මේක සරායා ඔයාට දෙන්න කිව්ව. "

හතරට නැමූ කඩදාසියක් මගෙ අතට දී සිනාසෙමින් එතනින් ගියේ මා දෙස අමුතු විදිහට බලමිනි .

සිනා සෙමින්ම මම කඩදාසිය දිග හැරියෙමි .

කූෂාන් කියන පිස්සු කොල්ලට.

 පිස්සෝ මට අද ක්ලාස් එන්න බෑ මම ලයිබරි එකේ ඉන්නවා පුලුවන් නම් එන්න

බැරි උනත් කමක් නෑ ඒත් එන්න මම බලන් ඉන්නවා.

මීට ඔයාගේම සරායා.

මට හිනාවක් ගියේ ඉබේටමයි මම කොලය යලි නවා සාක්කුවේ දාගෙන ආපසු ටවුමට එන්න ආවෙමි මගදී හර්ශත් කලුවාත් හමු උනත් මම ඉක්මනින් එන්නම් යයි පවසා ඔව්න් ගෙන් මිදී ආවෙමි .පංතිය පටන් ගැනීමට තව පැයක් පමණ තිබුනි .මා ලයිබරි ලඟට ලඟට එන විට සරායා

ලයිබරි එකෙන් එලියේ මා එන දෙස බලා උන්නාය දුඹුරු පාට සල්වාරිය ඇයට මනාව ගැලපුනි .

"මොකද ක්ලාස් කට් කරන්නෙ. "

මම සිනාසී ඇසුවෙමි .

"කව්ද ක්ලාස් කට් කරන්නෙ හ්ම්ම් යමු දැන් දෙන්නම ක්ලාස් මීට පස්සෙ අපි දෙන්නම එකට ක්ලාස් යන්නෙ තේරුනාද? "

මේ පිස්සු කෝලම මටම තමයි හරියන්නෙ මම ඇගේ අතින් අල්ල ගතිමි .

"ඔයාට බය නැද්ද මගෙ අතින් අල්ලගෙන යන්න මෙහෙම කුෂාන්."

"මම මොකටද බය වෙන්නෙ මේ අත ඇල්ලුවෙ අතහරින්න නෙවෙයි. "

මම ඇගේ මුහුනට එබී පැවසුවෙමි .

"ඔයා නම් මාරයි සුදූ. "

අපිදෙදෙනා පන්තියට එන විට පන්තිය පටන් ගන්න ඔන්න මෙන්න තිබූ නිසා පිටුපසම අසුනේ එක ලඟම වාඩි උනෙමු .නිමල්සර් පංතිය පටන් ගත්තේය .මම නෝට් එක ලියද්දිත් බැලුවේ

සරායාගේ දෑත් දෙකයි ඒ අත් ලස්සනට මෙහෙන්දි වලින් රටා ඇඳ තිබුනි .එක පාර  මා දෙස බැලූ ඇය

.

"මොනවද බලන්නෙ මෝඩයෝ නෝට් එක ලියන්නෙ නැද්ද ?"

 සරායා හිමීට ඇසුවේ මගෙ මුහුණ දෙස බලාය .

මටත් පිස්සුනේ සල්ලි ගෙවල ක්ලාස් ඇවිත් කෙල්ලක් දිහා බලන් ඉන්න .

"ඒ ගමන මොනවද කල්පනා කරන්නෙ. "

"මම අහු වුන දඬු අඬුවෙ තරම කියල බැලුවෙ. "

මම හිමීට පැවසීමි .

"අනේ ඇත්තද නරක්වෙලා තියෙයි මේ අඬුවට අහු උනොත්. "

ඇය කෝල ලෙස පවසා අතින් මුව වසා ගත්තාය .

මම ආස සරායාගේ මේ ඉරියව් වලටයි.

එදින නිමල් සර් එකොලහට ඉන්ටවල් වෙලාවේ ක්ලාස් එක නැවැත් වූයේන් .

අපිට පැය දෙකක් පමන එකට ගත කිරීමේ අවස්තාව ඇති විය .

"මොකෝ කරන්නේ සරා පැය දෙකක් තියනව අද ක්ලාස් ඉක්මනින් ඉවර කරයි කියල දන්නෙ නෑ නේ. "

"අපි ඉතින් මොනව කරන්නද ගෙදර යන් ඔයා දන්නවනෙ මට එහෙ මෙහෙ ඇවිදින්න බෑ කියල. "

"හරි අපි රජපිහිල්ලෙ බණ්ඩයියගෙ කැන්ටිමෙන් කාලා ගෙදර යන් ඔයා මොකද කියන්නෙ ඒ ගැන. "

"ඒකනම් ශෝයි ඒත් අලි ස්පන්ච්යි නෙක්ටොයි නම් බෑ හොඳද? "

"එහෙනම්. "

"අපි තෝසේ කාලා ප්ලේන්ටී බොමු. "

"තෝසේ කමු ඒත් ප්ලේන්ටී නම් බෑ. "

"ඒ මොකද? "

සරා ඇස් ලොකු කරන් ඇසුවාය.

"ප්ලේන්ටි මම බොන්නෙ නෑ කලු වෙනව අනේ. "

"අයියෝ කුෂාන් පොඩි ළමයෙක් වගේ නේ මොනවද අප්පා එතකොට මොනවද බොන්නෙ. "

"මම බොන්නෙ කිරි විතරයි ඒකත් නිවල. "

Author
KUSHAN HETTIARACHCHI

ඉතින් ලැජ්ජ වෙන්න ඕනේ නෑනේ ඇත්තම කීවෙමි.

"හා හා යන් මැරි කරපු දාක නලවන්නම්කො මම.
"

ඇය යෙහෙලියන් දෙසට හැරී.

"නා කුෂානෝඩ පෝරෙන් රිටර්න් වරුවෙන් අදුකාටි නීගලොල් ලයිබරිල ඉරුගෙ නාඟ අගුනකි වාරොම්.."

යයි පැවසුවාය.

එවිට ඔවුන් දෙදෙනා මා දෙස බලා සිනහ සෙමින්

"හා පෙයිටු වාඟ අල්ලාහ්ඩ කාවල්...
පත්තරම්..."

යයි පැවසූහ

මටනම් ඒ අන්ඩර දෙමල මුකුත් නොතේරුනි

අපි දෙදෙනා එන ගමන්

"මොකක්ද අර යාලුවන්ට දෙමලින් කිව්වෙ මට බැන්නද "

"අපෝ නෑ මම ඔයත් එක්ක ගිහින් ඉක්මනින් එන්නම් ලයිබරියට වෙලා  ඉන්න අපි එනකන්

කියල කිව්වෙ "
අපදෙදෙනා බණ්ඩයියාගේ කැන්ටිමට ඇවිත් තෝසෙ කා ටී බිව්වෙමු.
"යාලුවන්ටත් මොනව හරි ගමු නේද? "
මම සරා ගේ මුහුනට එබී ඇසුවෙමි.
"ඔව් කුෂාන් නැත්තම් හරි නෑනේ. "
මම ශෝර්ටීස්ට් කීපයක් පාර්සල් කර ගෙන එය සරායා අතට දුන්නෙමි.
"කුෂාන් ඇත්තටම අපිට මේක දිගටම කරගෙන යන්න පුලුවන් වෙයිද අපේ මස්සිනා ඊයෙ ආවා එයා කියනව ඉගන ගත්ත ඇති ඉක්මනට මැරි කරමු කියල. "
"ඔයා එක පාරක් හරි ආදරේයි කියල එයාට කියල තියනවද? "
"පිස්සුද අනේ මම ආදරෙයි කිව්වෙ ඔයාට විතරයි. "
මම සරායාගේ අතින් අල්ලා ගත්තෙමි .
"ඉතින් මම ඔයාව අත හරින්නෙ නෑ මම ප්ලෑනක් ගහල තියෙන්නෙ බැරිම උනොත් අපි ඉංග්ලන්ඩ්

යමු ඔයා ඒලෙවල්ස් ඉවර වෙනකම් අල්ලන් ඉන්න මම අපේ ඉන්දික අයියට කියල තියෙන්නෙ එයා ඉංග්ලන්ඩ් ඉන්නේ පාස්පෝර්ට් දැම්මම හදල තියමු. "

"ඔයා බබා වගේ හිටියට වෙරි ෆාස්ට් නෙ කුෂී. "

"ඔව් මම ඔයාව නැති කරගන්නෙ නෑ සරා ජාති ආගම් වලට නොබෙදි මිනිස්සු මිනිස්සුන්ට ගරු කරන කොහේ හෝ තැනක් තියේවි මේ ලෝකේ අපි ඒ තැනට ගිහින් ජීවත් වෙමු .මගෙ පවුලෙ අය ඇරුනාම මගෙ ලෝකේ ඉන්නෙ ඔයා විතරයි. "

එක වර සරා ගේ ඇස් වෙනස් විය මම දොරට පිටුපා සිටියෙමි. ඒ කියන්නෙ කවුරුන් හෝ ආවා සරා ශෝල් එකෙන් මුහුන ආවරණය කර ගත්තාය

.

"මොකද? "

මම ඇස් දෙකෙන් විමසුවෙමි .

දොර දෙස බලන මෙන් ඇය මට කීවෙන්.

මම හිමීට හැරී බැලුවෙමි .උසමහත මුස්ලිම් තරුණයෙක් තවත් මුස්ලිම් තරුණියක් සමග

KUSHAN HETTIARACHCHI

කැන්ටිමේ දොර අසල සිට කැන්ටිමේ සේවකයෙක් ගෙන් මොනවදෝ විමසයි .සේවකයා අත දික්කර පෙන්නුව දිශාවට ඔව්න් දෙදෙනා ගියෝය .ඔව්න් ගිය පසු

ශෝල් එක ඉවත් කල ඇය.

"අම්මෝ අල්ල දෙවියෝ මූන බැලුව ඒ කව්ද කියල දන්නවද? "

"නෑනෙ කව්ද ඒ. "

"කවද හරි ඔයාගේ මස්සිනා පොඩ්ඩ තමයි ඒ මගෙ අයියා යි එයගේ වයිෆුයි. "

"අම්මට සිරි අහු උනා නම් තමයි වැඩේ. "

මම කීවෙමි.

"දැන් බය නෑ කිව්ව නේද ?"

"මන් බය නෑ එත් ඔයාව ප්‍රොටෙක්ට් කර ගන්න ඕනනේ."

වේටර් බිල ගෙනාවෙන් මම බිල ගෙවා  සරා සමග ලයිබරියට එන්න ආවෙමු .

අපි එන විට සබ්‍රිනා සහ ෆසීනා ලයිබරි එක ලඟ බලා සිටියෝය.

අප ළං වූ පසු .

"ආ මෙන්න ඔයාලට කුෂාන් තමයි අරන් දුන්නෙ."

කියමින් සරායා අප ගත් ශෝර්ට්ඊස්ට් පාර්සලය ඔවුන් දෙදෙනා අතට දුන්නාය.

"රොම්බ තෑන්ක්ස් කුෂාන්. "

ඔවුන් මට පැවසුවේ සිනාසී ය.

"මේ ඔය අන්ඩර දෙමල මට තේරෙන්නෙ නෑ හලෝ. "

මම විහිලුවෙන් කී වෙමි.

"මෙයාට දෙමල ටිකක් ඉගන ගන්න වෙයි නේද සරායා. "

සබ්‍රිනා පවසද්දී.

"මේ මේ සින්හලත් හරියට බෑ මොන දෙමලද ඔයාලා සින්හල ඉගන ගත්තනම් ඉවරනේ. "

මම සිනා සෙමින් පැවසීමි .

"යේක ශරි තමයි. "

මෙතෙක් නිශ්ශබ්දව සිටි ෆසීනා පැවසීය.

"කුෂාන් අපි නාරම්මලට යනකම් එක බස් එකේ යමුද? "

Author
KUSHAN HETTIARACHCHI

"හ්ම්ම්. "

"මොකද හ්ම්ම් කියන්නෙ මට ඔයා එක්ක හුඟක් ලඟින් ඉන්න ඕනේ. "

"හරි බබා යමු මම ඇගේ අතින් අල්ලා ගතිමි. "

එහෙම්මම බස් ස්ටෑන්ඩ් එකට යන්න කහ ඉරෙන් පාර මාරු වෙද්දී ඉදිරියට ආවේ අපේ පංතියේ චීත්තේ රංජන් සහ ඔහුගේ යාලුවා වූ ප්‍රසන්නයි .රංජන් මා දෙසත් සරා දෙසත් බලද්දී මම කලේ ඇගේ අත අතහරිනු වෙනුවට තවත් තද කර අල්ලා ගැනීමයි .

රංජනයා ගියේ පල්හිනාවක් දාගෙනයි.

"සරා ඕකා ශුවර් ලෙඩක් දානව ඔයා ඕනම කෙනෙක් ඇහුවොත් කියන්නෙ අපි දෙන්න යාලුවො කියල විතරයි. "

මම ඇය සමග නාරම්මල බසයේ පිටුපස අසුනට බර වෙමින් පැවසුවෙමි .

අපට ඉදිරියෙන් වූ අසුනේ සබ්‍රිනා සහ ෆසීනා වාඩි උනි සරායා අප හතර දෙනාටම ටිකට් ගත් අතර.

"කුෂාන් ඔයාට ප්‍රශ්නයක් වේවිද ඉස්කෝලෙන්. "

"ඔයා බය නැතිව ඉන්නකෝ සරා. "

"ඒ උනාට මට බයයි අප්පා. "

"මුහුද හත් ගව්වක් තියල අමුඩ ගහල වැඩක් නෑ. "

"මොකක්ද අමුඩ ගහනව කියන්නෙ. "

කාපන්කෝ දැන් ඉතින් අමුඩ ගහන හැටි කොහොම කියල දෙන්නද?

"මේ ඒක කියමනක් විතරයි සරා. "

කතාවෙන් කතාවෙන් අපි නාරම්මලටත් ආවෙමු .

සරා ලා කැකුණගොල්ල බසයට ගොඩවුන අතර මම කුලියාපිටිය බස් එකක එල්ලී ගෙදර ආවෙමි .

මම ගෙට ඇතුලු වී කාමරයට යන්න හදද්දී.

"පොඩ්ඩක් ඔහොම නවතිනව. "

මම එතකොටයි සාලේ ඉඳගෙන හිටිය අම්මව දැක්කෙ කවදාවත් නැතුව අම්ම ඩෝන් ගිහින් ඉන්නෙ ඇයි .

"දැන් ක්ලාස් යනව කියල කෙල්ලන්ව ඇව්දන්නද යන්නෙ. "

"මොනව අම්මට පිස්සුද? "

"අම්මටනම් පිස්සු නෑ පුතාට නම් පිස්සු හැදීගෙන

එනව වගෙයි. "

"දැන් මොකක්ද උනේ කියන්නකෝ. "

මම පොත සාලයේ සැටියෙන් දමා පුටු ඇන්ද උඩ ඉඳගත්තෙමි.

"කවුද සරායා කියන්නෙ. "

මගේ සහජ නුවණ හිස් මුදුනට ආවේය.

"සරායා කියන්නෙ මගෙ හොඳම යාලුව අම්මට මේකද ප්‍රශ්නෙ අද කහ ඉර පනිද්දි මම එයාගෙ අත අල්ලන් නම් ආවා, එයා චුට්ටක් අසනීප වෙලා හිටියේ අම්මට ඕකනම් තියන ප්‍රශ්නේ ඒ ගැන වැඩිය හිතන්න එපා අම්මට ඔය ගින්න දීපු කෙනත් මම දන්නව ඒ රංජන් අනික එයා සරායා පස්සෙන් එනව ඉතින් ඒ ළමය කැමති නෑ උං හිතන් ඉන්නෙ මම සරායා එක්ක ලව් කියල. "

අම්මා ටිකක් කූල් වූ ගතියක් පෙනුනි අම්මෝ ඇති මම කිව්ව බොරුව අම්මා පිළිගත්තාය .

"හැබැයි ඔය තම්බි කෙල්ලො එක්ක පැටලිලා මට අහු වෙන්න නම් එපා පුතේ තේරුනාද? "

"අම්මට පිස්සුද? "

රංජන් ගෙදර ෆෝන් එකට කෝල් කර මේ ගින්න දී තිබුනි .

එකට කෙහෙල්කන් කැවත් බොක්ක ශොපින් කියන්නෙ ඕකනේ .

මම නාගෙන එහෙම ඩේවිඩ් ට කෝල් එකක් ගත්තෙමි.

"මචන් මම කුෂාන් කතා කරන්නේ ."

"ඔව් මචන් කියපන්. "

"හවස අපේ දිහා වරෙන් බන් මේක අර්ජන්ට්. "

"ඕකේ මචන් මන් කොහොමත් එන්න හිටියෙ මොකක් හරි අවුලක් ද? "

"ඔව් බන් ඉක්මනින් වරෙන්. "

මම රිසීවර් එක තැබුවෙමි .

පැය බාගෙකට පමණ පසු ඩේවිඩ් ආවේ ඔහුගේ කාරයෙනි .

ඔහුආ පසු .

"අම්මේ මම ඩේවිඩ් එක්ක ඉස්කෝලෙට ගිහින් එන්නම්. "

කියමින් ම මම කාරයට නැගුනේ ඩේවිඩ් ට බිමට

බහින්නවත් කාලයක් නොදෙමිනි.

"මොකද බන් වෙලා තියෙන්නෙ. "

ඩේවිඩ් ඇසුවේ පුදුමයෙනි.

"යමු යමු ඉක්මනට නක්කවත්තෙ වැව ගාවට. "

"මොකද වැවට පනින්නද? "

ඩේවිඩ් ඇසුවේ විහිලුවෙනි.

"නෑ මාලු බාන්න මව යකා කර ගන්නෙ නැතුව කියපු දේ කරපන්. "

මම ටිකක් සැරෙන් කීවෙමි .

නැත්තන් අම්ම මෙතෙන්ට ඇවිත් සරායා ගැන ඇහුවොත් මේ ගොනා අනිවාර්යයෙන් තප්පුලනව ඇයි වෙච්ච දේ අටක් පහක් මූ දන්නෙ නැනේ .

ඩේවිඩ් කාරය හරවා මහ පාරට ආ පසුයි මගෙ ඇඟට ලේ ටිකක් ඉනුවෙ.

ඩේවිඩ් ඉස්කෝලය පාස් කර කාරය නැවැත්වූයේ .

"කුෂාන් දැන්වත් කියපන් මොකක්ද අද පෙරල ගත්ත බාල්දිය. "

ඩේවිඩ් හරියටම නූලට විමසුවේය .

"මචන් මාර වැඩේනේ "

මම සරායාගේ අත අල්ලන් කහ ඉර පනිද්දී රංජන් දුටු තැන සිට .ගෙදර ආ පසු අම්මා බැන්න තැනට එනකම් සියලු දේ අකුරක් නෑර ඔහුට පැවසීමි .

"මම උඹට කිව්ව නේද ඕකා දෙපිටකාට්ටුව කියල ,"

ඩේවිඩ් කියද්දී.

"හ්ම්ම් ඒත් මම හිතුවෙ නෑ ඕකා ඔය තරම් අබ්ලික් චරිතයක් කියල. "

"මම නම් කුෂාන් ඕකා ආව දා ඉඳල අඳුන ගත්තේ ඕකා ඕක බද්‍රා මිස්ට වත් කිව්වොත් විනාසයි. "

"ඒක තමයි  මොකද කරන්නෙ බන් ඒකට. "

"ඒක තමයි බලමුකො හෙට ඉස්කෝලෙ ගිහින් කොහොමටත් මූ ගින්න දෙනවනම් දැනටම දීල ඇති උඹලගෙ ගෙදරට කිව්ව වගේ මිස් ටත් කෝල් කරල කියන්න ඇති. "

"මට බය වෙන මොකවත් නෙවෙයි සරාට ප්‍රශ්නයක් වෙයිද කියල බන්. "

"උඹයි ඒකියි ලිව්ම් එහෙම හුවමාරු කරන් තියනවද?"

KUSHAN HETTIARACHCHI

ඩේවිඩ් ඇසුවේ මුහුණ බැරෑරුම් කරගෙනයි .

"ලියුන් දීල නෑ බන් ඔය බයෝ පොතේද කොහෙද අග නිසදැසක් ලියලනම් තියනව. "

"පැණි නිසදැසක් වෙන්න ඇති වෙලහකට. "

"නැතුව ශෝක ප්‍රකාශ ලිව්වෙ නෑ ඔටුවෝ. "

"අපි දැන් ගෙදර යමු කුෂෝ හෙට උදේම්ම ගිහින් බලමු මොනවද කරන්න පුලුවන් කියල. "

රෑයේ මට නම් නින්දක් නොවිනි.

රංජන් ජයවීර ඔකට අපි කොහොමද සැලකුවේ අලුතෙන් උසස් පෙලට අපේ ඉස්කෝලෙට ආව වෙලාවේ රැග් වෙන්න නොදී බේර ගත්තේ මමයි, ඩේවිඩුයි ඒ අපි දෙදෙනාම රැග් එකට තදින් ම විරුද්ධ නිසා .අපි නයෙකුට මෙච්චර දවස් කිරිපොවා ඇති සැටියකි .

*-*-*-*-*-*-*-*

පසුදා වෙනදාටත් වඩා උදෑසනින් ඩේවිඩ් සහ මම පාසලට ගියෙමු . වෙලාවට ඒ වෙනකොටත් සරායා පැමිණ සිටියාය .

"ගුඩ් මෝර්නින්ග් දෙන්නටම. "

ඇය මුව පුරා සිනාවකින් සරසාගෙන අප දෙදෙනා දෙසම බලා කිව්වාය.

මේ රෝස මලක් වගේ ඉන්න කෙල්ලව මම කෙසේවත් නැතිකර නොගනිමියි .මම මගේ හිතේ තදින් සටහන් කර ගතිමි.

"ගුඩ් මෝර්නින්ග් සරා ."

ඩේවිඩ් පොත් ටික තබා පංතියෙන් එළියට ගියේ මටත් සරාටත් තනිවම කතා කරන්න අවස්තාව තබාය.

මම දන්නා පරිදි හැම දේම සරාට පැවසුවෙමි .

කතාව කියා අවසන් වෙන විටයි මම දුටුවේ සරාගේ ඇස් වල කඳුලු.

"සරා ඇයි මේ අඬන්නෙ අඬන්න දෙයක් වෙලා නෑනේ අපි දෙන්න එන ඕනම දේකට මුහුන දෙමු. "

"ඒත් මම නිසානේ මේ ඔක්කම කරදර. "

"එහෙම නෑ බබා ඔයාගෙන් කවුරු ඇහුවත් මම ඔයාගෙ යාලුව විතරයි කියන්න මොකද මොකා මොනව කිව්වත් සාක්ශි නෑනේ. "

දැන් දැන් ළමයි එකා දෙන්න එන නිසා අපි කතාව

නවත්වා වෙන් උනෙමු .

රංජන් පාසැල් පැමිණ සිටියේ නැත ඒක හොඳම සාක්ශිය මූ ගේම දුන්න කියන්න.

"මචන් අරූ අද එන්නෙ නෑ වගේ ඕකම තමයි ගේම දීල තියෙන්නෙ "

ඩේවිඩ් පවසද්දී.

"ඒයි ප්‍රසන්නය මෙහෙ වරෙන්. "

මම රංජන් ගෙ අතිජාත මිතුරා ප්‍රසන්නට කතා කලෙමි.

"ඇයි කුෂාන්. "

"උඹල දෙන්න මොන කොමිනිකේශන් එකෙන් ද අපේ දිහාට ඊයේ කෝල් එක ගත්තේ ."

"අ-පි ගත්තෙ නෑ. "

"පලයං බොරු නොකිය තෝරු මෝරු එක්ක තියන ගනුදෙනු වලට මම හාල් මැස්සො අල්ල ගන්නෙ නෑ. "

මම ඔහුව අතහැර දැම්මත් ඔහු කිව්වෙ බොරු කියා ඔහුගේ ඉරියව් වලින් මම් දැන ගත්තෙමි .

පාසැල පටන් අරන් පලවන පීරියඩ් එක

අවසානයේ.

පොඩි කෙල්ලො දෙන්නෙක් පන්තියට ඇවිත්.

"කුෂාන් අයියට බද්‍රා මිස් බයෝ ලැබ් එකට දැන්මම එන්න කිව්ව. "

කියා යන්න ගියෝය.

"වැඩේ හරි වගේ නේද? "

ඩෙලා අසද්දි මම බයෝ ලැබ් එකට යාමට එළියට බැස්සෙමි .

මම බයෝ ලැබ් එකට යන විට බද්‍රා මිස් අපේ උසස්පෙල ව්‍යාපෘති යෝජනා වගයක් බලමින් සිටියාය.බිම බලන් සිටි නිසා ඇය මාව නොදැක්කාය. ඒනිසා මම .

"එක්ස්කියුස් මී මිස් මම එන්නද? "

මම පැවසුවේ ගැහෙන හදවතිනි.

හිස ඔසවා මා දෙස බැලූ මිස්.

"ආ කුෂාන් එන්න මම පණිවිඩයක් යැව්වෙ ඔයාගෙ මේ ප්‍රොජෙක්ට් ප්‍රපෝසල් එකේ පොඩි ගැටලුවක් තියනවනෙ පුතේ. "

ම්ම් වැඩේ පත්තුවෙලා නැති හැඩයි.

"මොකක්ද මිස්? "

"ඔයා මේ කියන ප්‍රොජෙක්ට් එක කරන්න පුලුවන් ද? මේ කියල තියන විදිහට. "

"පුලුවන් මිස් ඕක කවුරුත්ම නොකරපු එකක්. "

"ඒක තමයි මේකට ඔයාට ගොඩක් මහන්සිවෙන්න වෙයි. "

"ඔව් මිස් සොබාදහමේ චමත්කාරය කියන්නෙ පුලුල් විශයක් ඒත් මම ඒකට ආසයි මට දර්ම කුමාර සරුත් උදව් කරන්නම් කිව්ව ප්‍රොජෙක්ට් එක කර ගන්න ඒ හින්ද ගැටලුවක් නෑ මිස්. "

"මම ඒකයි ඔයාට කතා කලේ මේක අමාරුනම් වෙන එකක් කරන්න කියල. "

"නෑ මිස් ඕක කරන්න පුලුවන්. "

"අනිත් එක කුෂාන් අර සරායා කියන්නෙ අපේ පංතියට මේ අවුරුද්දෙ ආපු ළමයි දෙන්නගෙන් එක්කනෙක් නේද ?"

මිස් ඒක අහද්දිනම් මගෙ හාට් බීට් එක වැඩිඋනා කියල තේරුනා ඒත් මම වෙනසක් නම් පිටට පෙන්නුවේ නෑ .

"ඔ-ව් මිස් ඇ-යි. "

"මේක වැඩිය හිතන්න එපා ඊයේ මට කෙනෙක් නිර්නාමිකව කෝල් කරල ඔයයි සරායයි අතර අෆයාර් එකක් තියනව කියල කිව්ව මම ඒක වැඩි ගනන් ගත්තේ නෑ කතා කරපු කෙනා හඬ වෙනස් කරලයි කතා කරේ. "

මගේ තීක්ෂණ මොලය යලි වැඩ කරන්න පටන් ගති දෙන්නම් රංජෝ ජම්බු ඇප නැතිවෙලා යන්න.

"හ්ම්ම් මිස් ඊයේ මම ගෙදර එද්දි ඔය විදිහටම කෝල් එකක් අපේ ගෙදරටත් දීලා තිබ්බ. "

"ආ ඒකත් එහෙමද කව්ද ඔක කරන්න ඇත්තෙ. "

"මිස් මම නම් දන්නව ඔක කරේ අපේ පංතියේ රංජන් ජයවීර. "

"ඒ කොහොමද එහෙම කියන්නෙ හරියටම. "

"මිස් මිනිහනෙ සරායා ආව දා ඉඳල පස්සෙන් යන්නෙ ඒ ළමයට වද දිදී. "

"ආ එහෙමද මිනිහ එතකොට වැරදි කර කර ද මේ සුද්ද වෙන්න යන්නෙ. "

"ඔව් මිස් මිස්ට සාක්ෂි ඔනෙනම් මෙන් තියනව. "

මම කවුරුවත් නොදැන මා ලඟ තිබුනු සරායා ආව දවස් වල රංජන් ඇයට ලියූ ලිපියක් මා ලඟ සුරැකිව තිබුනි මම එය මිස් අතට දුනිමි .

"මේක මොකක්ද? "

"මිස්ම බලන්නකො. "

මිස් ලියුම කියවා බලා.

" මේක ඔයාට කොහෙන්ද? "

"ඕක යවල තියෙන්නෙ පොඩි ළමයෙක් අනේ මම ඒ ළමයගෙන් ගත්තෙ. "

රංජන්ගෙ ව්‍යපෘති යෝජනාව අතට ගත් මිස් ලියුමෙයි යෝජනාවෙයි අත් අකුරු සැසදීය.

"හරි අත් අකුරු සීයට සීයක් සමානයි මම මිනිහගෙ වෙස්මූන ගලවන්නම්."

මිස් කීවේ තරහිනි.

"අද ඇවිත් ඉන්නවද රංජන්. "

"නෑ මිස් අද ඇබ්සන්ට්. "

"හෙට එයි නෙ, කුෂාන් දැන් පංතියට යන්න.  "

"මම ඇවිත් සිදු වූ දෙය ඩේවිඩ් ට කී වෙමි."

"හොඳ වැඩේ ඕකාට උඹ නියම වැඩේ කලේ

මටවත් කිව්වෙ නෑනේ. "

"නෑ බන් වැඩේ දීලම තමයි කියන්න හිටියෙ මට ඕක කලින් ම දෙන්න තිබ්බ මම බලු වැඩ කරන්නෙ නෑනෙ මචන් ඕකා මට බලු වැඩේ කරපු හින්ද තමයි මමත් ඒ වැඩේ කලේ හොද වෙලාවට ඔය ලිවුම ගෙදර තිබ්බ. "

"අම්මෝ මීටපස්සෙ ඕකාගෙන් පරිස්සන් වෙලා ඉන්න ඕනේ හර්ශ කිව්වෙ කලුවාගේ කරට අතක් දා ගනිමිනි. "

සරායා ට  මම මේ ගැන කියද්දි ඇගේ ලස්සන ඇස් අයා මා දෙස බලා සිටි අයුරු අදටත් අමතක නැත මම ඇයට කීවේ ඉන්ටව්ල් එකේ බත් කද්දීය.

"ඔයා නම් මාරයි කුෂාන් අරියට ශෙර්ලොක් හෝම්ස් වගේ හැම දේ ගැනම හිතනව නේද? "

"නැතුව බෑනේ මගෙ තංගච්චිව බලා ගන්න. "

"අනේ යනව යන්න මම තංගච්චිද? "

"නැතුව මගෙ තම්බිච්චිනෙ ඔයා. "

"මේ දෙන්නගෙ තියන ලව් එක නේද ඩේවිඩ්. "

ඩේවිඩ් ට එසේ කීවේ අප ලගින් ගිය නිරාශා ය ..
"ඒකනෙ නිරෝ. "
ඩේවිඩ් නිරාශා එක්ක ගියේ මගේ පිටට තට්ටුවක් දා ගෙනය .
එදින හවස අපි නිවෙස් වලට ආවේ හෙට රංජන්ට පත්තුවෙන ගින්න ගැන සිතමිනි.

*_*_*_*_*_*_*_*_*_*_*_*_*_*_*_*_

පසුදා උදේ අප වෙනදා මෙන් පාසැල් ගියෙමු .රංජන් ද උදෙන්ම පැමිණ සිටියේය . ඩේවිඩ් සහ මැත්ස් එකේ සනත් රංජන් ට ගැසීමට පාරම් බබා සිටියත් මම ඔවුන් දෙදෙනා කූල් ඩවුන් කලේ මේ සිද්දිය දන්නෙ අප කීපදෙනා විතරක් නිසාය.
"පොඩ්ඩක් ඉවසපල්ලකො මට ඕනේ මූට සර්ප්‍රයිස් එකක් දෙන්න. "
ඉස්කෝලය පටන් ගැනීමේ සීනුව නාද විය .සැමෝම පන්සිල් ගත්තෝය උදේම තිබුනේ බයෝ පීරියඩ් දෙකකි අද නම් නියමෙටම වැඩේ පත්තුවේ
.

KUSHAN HETTIARACHCHI

පන්සිල් ගෙන අවසන්වූ පසු උදෑසන ප්‍රවෘත්ති විකාශනයද නිම විය.සිදු වූයේ නොසිතූ දෙයකි .

බද්‍රා මිස් පන්තියට ගොඩ වූයේ අපේ ප්‍රින්සිපල් සර් සහ අංශ බාර වික්‍රමසිංහ සර් සමගය .

මුකුත් නොදත් අසරණ රංජනයා ඉඳගෙන සිටියේය .

ගුරු පුටුවේ විදුහල්පති තුමා ඉඳගත් අතර වික්‍රමසිංහ සරුත් බද්‍රා මිසුත් හිටගෙන සිටියහ

බද්‍රා මිස්

"රංජන් ජයවීර  නැගිටල ඉස්සරහට එනව, තමුන්ට විරුද්දව පැමිණිලක් තියනව ."

මොකවත් නොදත් රංජන් උඩ බිම බලයි.

රංජන් ඉස්සරහට ආවේ මරන්න ගෙනයන සතෙකු ලෙසය .

"දැන් කුම්බලා කරවල කෑවනම් විදවපන් කො. "

මම මටම මුමුණා ගත්තෙමි .

බද්‍රා මිස් රංජන් ගේ ව්‍යාපෘති යෝජනාවයි මම දුන්න ලියුමයි දෙකම ප්‍රින්සිපල් සර් අතට දුන්නාය

.

සරායා
KUSHAN HETTIARACHCHI

"මේ දෙකේම අකුරු සමානයි බද්‍රා මිස් "
ප්‍රින්සිපල් සර් පැවසුවේ රංජන් දෙස බලා ගෙනය.
"ඇයි තමුන් හොඳ මූන පෙන්නගෙන නරක වැඩ කරන්නෙ මේ ලියුම තමුන් දීලා තියෙන්නෙ සරායට. "
බද්‍රා මිස් කියද්දී අපේ ගොන්ජා බිම බලා ගත්තේය.
ඕකා හිතන්න ඇති මාත් එක්ක හැප්පිලා දිනන්න දැන් සතුටුයි නෙ.
"තමුන් ශිෂ්‍ය නායක කමටත් ඉල්ලල තියනව නේද? "
ප්‍රින්සිපල් සර් එක එල්ලේ ඔහු දෙස බලා ඇසුවේය.
"ඔව් සර්. "
"දැන් පෙරේදා කුෂාන් ලගෙ ගෙදරට කතා කරල තමුන් මොකක්ද කිව්වෙ. "
ඒ පැනය ඇසුවේ වික්‍රමසිංහ සර් ය.
රංජන් බුවා පංතිය ඉස්සරහ පච වී චොරි වී කරගන්න දෙයක් නැතිව අසරණ වී සිටියේය .
"අනික අපේ ගෙදරට කතා කරල නිර්නාමිකව කේලම් කිව්ව. "

ඒ බද්‍රා මිස් ය.

"ඔයිට වඩා හොඳයි හෙට ඉඳල ගවුමක් ඇඳගෙන ඇවිත් ගෑනු ළමයින්ගෙ පැත්තෙන් වාඩි වෙනව. තමුසෙගෙ ශිෂ්‍යනායක ඉල්ලුම්පත්තරේ ඔෆිස් එකට ඇවිත් ආපහු අරන් යනව හරිනම් දෙමවුපියො ගෙන්නල කියන්න ඕනේ මෙච්ච යනව ගිහින් ඉඳගන්නව. "

ප්‍රින්සිපල් සර් කියන්න ඕන දේ ඕනෑවටත් වඩා කිව්වෙය රංජා ඇවිත් උගෙ ඩෙස් එකේ ඔලුව ගහ ගත්තේය .

ප්‍රින්සිපල් සරුයි වික්‍රමසිංහ සරුයි බද්‍රා මිසුයි පංතියෙන් පිටවී ගියෝය .

මමයි ඩේවිඩුයි රන්ජන් ගේ ඩෙස්ක් එක ලඟට ගියෙමු .

"අප්පුහාමි නැගිටපන්. "

මම සැරෙන් කිවෙමි .රන්ජන් හිස ඔසවා බැලුවේ අසරණ ලෙසය.

"උඹ හැදුවෙ මගෙයි සරායගෙයි අෆයාර් එක කඩන්න නේද? දැන් උඹට සතුටුද? .අනික මතක

තියාගනින් සරායා කියන්නෙ මගෙ කෙල්ල එකිව මේ ලෝකේ වෙන කාටවත් අයිති නෑ උඹ පුලුවන්නම් කඩල පෙන්නපන් අෆයාර් එක. "
මම කියද්දී .
."අනික ඒකි මේ උඹ වගේ හම්පඩයෙක් ට කැමතිවෙනේ නෑ බන්. ඒකි හරියන්නෙ කුෂාන් වගේ පොරකට විතරයි දැක්කනෙ උඹ හැරෙද්දි උඹට කරටි කැඩෙන්නම උෟ ගහල ඉවරයි. "
ඩෙලා කිව්ව කතාවට කොල්ලො සෙට් එකම විසිල් එකක් ගැසුවෝය.
"අනික මම උඹට සැලකුවෙ සහෝදරයෙකුට වගේ උඹ මොකක්ද ඒ කරපු බලු වැඩේ උඹ හිතුවද ඕක කරපුවහම උඹට සරා ව හම්බෙයි කියල.මොලෙන් නම් මොලෙන් අතින් පයින් නම් අතින් පයින් මම ඕන දේකට ඔට්ටුයි අදින් පස්සෙ උඹෙයි මගෙයි කිසිම කනෙක්ශන් එකක් නෑ. "
මට කෝපයට ඉතිරි ටික කියා ගැනීමට නොහැකි විය .
සවස සරා සමග බස් හෝල්ට් එකට යන වෙලාවේ.

"කුෂාන් ඔයා ඔච්චර නපුරුයි කියල මම හිතුවෙ නෑ. "

"ඇයි සරා. "

"ඔයා උදේ හැසිරුනු විදිහ. "

"සරා ඔයා කියන්නෙ මගෙ වටිනාම වස්තු වලින් එකකට හරි අත තියන්න හදපු එකාව හරහට අරන් නලවන්න කියලද? "

ඒ කතාවට සරාට හිනා ගියාය ඇය තම සුරතින් මුව වසා ගත්තේ ලැජ්ජාවෙනි.

"ඔයා දවසක මාව මැරි කරන්න ගියාම එන ප්‍රශ්න වලටත් ඔහොමද හැසිරෙන්නෙ. "

"ඒක ඒ වෙලාවට බලා ගමු තේරුනාද සරා මම හැසිරෙන්නෙ හැසිරෙන්න ඕන හොඳම විදිහට. "

"අම්මෝ මගෙ මහත්තය හරි වසයි නේ. "

"මේ සරා ඉංග්ලන්ඩ් වැඩේ හරි අපි ඒලෙවල්ස් කරපු ගමන් යනව අපිට තව අවුරුද්දක් ම තියනව මම ඉන්දික අයියට කතා කරල තියෙන්නෙ ඉක්මනටම පාස්පෝර්ට් දෙක හදන්න ඕනේ "

"ඔයා මේ හැමදේම ප්ලෑන් කරනව නේද රත්තරන්.

KUSHAN HETTIARACHCHI

"

"නැතුව අර ගොබිල ඔයාව අරන් යනකන් බලන් ඉන්නද? "

"අනේ අනේ. "

සරා මගෙ පිටට තට්ටුවක් දැම්මාය .

"සරා අපි IELTS එක්සෑම්එක කරන්න වෙනවා. "

"ඒ ලෙවල්ස් අස්සෙ ඕකත් කරන්න පුලුවන් ද? "

"කොහොමත් කරන්න වෙනවනේ ඔයා රෙඩි නේද? "

"මම රෙඩි සුදෝ. "

"මට හෙට පේපර්ස් ටික හම්බෙනව හෙට නිවාඩුනෙ මම කොහොමද ඔයාට මේවා දෙන්නෙ

.

ඔයා අපේ දිහා එන්න. "

"ඔයාලගෙ දිහා සරා ඔයාට පිස්සුද? "

"නෑ නෑ ඔයා එන්න මම හැමදේම බලා ගන්නම්. "

ඈතින් කැකුණගොල්ල බසය පැමිණියෙන් සරා යාමට සූදානම් විය.

"මම යන්නම් ඔයා පරිස්සමින් යන්න කුෂාන්."

සරායා
Author
KUSHAN HETTIARACHCHI

*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*

පසුදා නිවාඩු දවසක් වූයෙන් මම කුරුණෑගල ගියේ IELTS පේපර් සහ නෝට්ස් ටික මගෙ යාලුවෙකුගෙන් අරන් ඒමටයි .උඟ වෙලාවටත් කලින් ඇවිත් සිටියේය .

"දිනේශයා කොහොමද උඹ කලින්ම ආවා නේද? "

මම අත වනාගෙනම දිනේශ් ලඟට ගියෙමි.

"ඔව් බන් මම මේක දෙන්න හින්දමයි අද වැඩියක් ආවේ උඹට කණුව තියන්න බෑනේ. "

ඔහු මට නෝට්ස් ටිකයි පේපර් ටිකයි දුන් සැනින් බසයක එල්ලුනේ මට වේව් එකකුත් දමාගෙනය.

මම පේපර් ටික අරන් සමුද්‍රා එකෙන් ෆොටෝ කොපි කර ගත්තෙමි .ඒ එක්කම ආ ටෝනි අයියාගේ බසයේ එල්ලුනේ සරාලාගෙ නිවසට යාමටය .

නාරම්මලින් බැස මම සරා ගේ නිවසට යන නිසා බිස්කට් පෙට්ටියක් ද ගෙන කැකුණගොල්ල බසයට ගොඩවීමි.කැකුණගොල්ල බසය ගියේ ගාටමිනි .සරා ලියා දුන් මාර්ග විස්තරය අනුව මම

අදාල තැනින් බසයෙන් බැස ගුරු පාරේ මදක් දුර ගියෙමි .ම්ම් මේ තියෙන්නෙ ගෙදර වෙන්න ඕනේ කොලපාට ගා තිබූ තරමක් විශාල ගෙදර මිදුලේ සිටි මැදිවයසේ මිනිසාගෙන් මම

"අංකල් සරායා ගේ ගෙදර මෙහෙද? "

මා දෙස හොඳට බැලූ ඔහු.

"ඔව් පුතා ඔයා කව්ද ?"

"මම එයාගේ යාලුව මේ පේපර් වගයක් දෙන්න ආවේ. "

"ආ ඉන්න මම කතා කරන්නම් මෙහෙ තමා එයාගේ ගෙදර එන්න ඇතුලට. "

මම වත්තට ඇතුල් උනෙමි .

ඔහු

"සරායා..සරායා. "

කියද්දී සරායා ගෙදරින් එලියට ආවාය ඇය ඇඳ සිටියේ ලා කොල පැහැති සල්වාරියට ඇයව තවත් ලස්සනට පෙනුනි .

"ආනේ කුෂාන් එන්න එන්න. "

මට පවසන ගමන් ඇය මැදිවියේ මිනිසා දෙසට

හැරී

"ඩෙඩා ඉදු ඒන්ඩ ෆ්‍රෙන්ඩ් කුෂාන්."

යයි කීවාය .

"ආ අපිඩියා.."

ඔහු පැවසුවේ මා දෙස බලා සිනාසීය.

"කුෂාන් මේ මගෙ තාත්තා ."

"හායි අංකල්. "

"පුතා එන්න ගෙට වාඩිවෙලා කතා කරමු ඔයා ගැන සරායා නිතරම කියනව අරියට උදව් කලාලු ගිය මුල් දවස් වලම. "

සරායාගේ තාත්තා පැවසුවේය.

මම සාලේ සැටිය උඩ වාඩි වෙන ගමන් ම සරායාට ෆොටෝ කොපි කල පේපර් ටික දුන්නෙමි.

"මොනවද බොන්නේ  කූල් ද රස්නෙ මොනව හරිද? "

සරායා ඇසුවේ ඇගේ තරු නෙත් විහිදුවමිනි.

"කූල් එකක් බොමු සරා. "

"පුතා මම එලියෙ කර කර හිටපු වැඩේ ඉවර කරල එන්නම්. "

කියමින් ඇගේ පියා යලිත් මිදුලට විය.

සරා ඇතුලට ගොස් පැමිණියේ බීම බිස්කට් සහ කේක් තබා ගත් බන්දේසියක් අරගෙනය.

කෙල්ල සෑහෙන්න මම එන එකට ලෑස්ති වී වාගේය.

"කෝ අම්මා එහෙම සරා. "

"අම්ම අයියලාගේ ගෙදර ගියා දැන් ඒවි ඔයා දවල් කෑම කාලා නේද යන්නේ. "

සරා ඇසුවේ මට කේක් සමග බීම බන්දේසිය පිලිගන්වන ගමන් ය .

"හිත සතුටින් දෙන එක නොකා බෑ නේ. "

"අනේ යනව යන්න කට නම් තියනව වක්කඩේ වගේ. "

බීම බොන අතරේ බයික් එකක සද්දයක් එලියෙන් ඇසුනි .

ආදරය යනු

අතහැරීමක් මිස

තරයේ අල්ලා

බදාගැනීමක් නොව

කුෂාන් කුෂී

ඔය එනවා ඇත්තේ සරා ගේ අම්මලයි මා සිතුවා නිවැරදි විය යුතුය. පාරේ ආ බයිසිකලය ගෙදර වත්තට ඇතුලු වී ගේ ඉදිරිපිට නතර උනි එහි සිටියේ එදා බංඩියියලාගේ කැන්ටිමේ සිටියදී දුටු හැඩි දැඩි කොල්ලාය .ඔහු ගෙට ගොඩ උනේ සිනාසීගෙනය ඊට පසු පසින් පැමිණි කාන්තාව සරායාගේ පෙනුමම තිබූ තැනැත්තියකි මේ නම් ඇගේ අම්මා විය යුතුය .

"උම්මා ඉදු ඒන්ඩ ෆ්‍රෙන්ඩ් කුෂාන්. "

සරා පවසද්දී.

"පුතා ගැන දුව ගොඩක් කියල තියනව ඔයා අද එනව කියලත් කිව්ව ,කෑම කාල නෙ යන්නේ .මම කෑම ටිකක් ලෑස්ති කරන්නම්. "

ඇය සිනා සී පවසා සරායා සමග ඇතුලට ගියාය.

"මල්ලි බස් එකේද ආවේ ?"

සරායාගේ අයියා ඉදිරි අසුනේ ඉඳ ගන්න ගමන් සුහදව කතා කලේය.

"ඔව් අයියේ බස් එකේ. "

Author
KUSHAN HETTIARACHCHI

"ඔයා කෑම කාලානෙ යන්නෙ මම ගෙනිහින් අරලින්නම් හවස බස් එක නැති වෙයි අද? "
"අයියට කරදරේ නේද? "
"නෑ නෑ ඕක මොකක්ද ඔයා සහෝදරයෙක් වගේ නංගිව බලා ගත්තලු. ඉතින් එහෙම කෙනෙක් ට නොසලකා කොහොමද? "
"ඒවනම් මොනවද අයියේ. "
"මම ගෙදර ගිහින් කා එක අරන් එන්නම් හවස අපි යද්දි වහින්න ඉඩ තියනව. "
"හා අයියේ. "
අයියා පිටවූ පසු සරා යලි සාලයට පිවිසියාය .
"මොකද මස්සිනා කියන්නෙ. "
සරායා ඇසුවාය .
"මාව ගෙදරටම ගිහින් දාන්නම් කිව්වෙ. "
"කුෂාන් කෑම ලෑස්තියි මේසෙට තියන්නද? "
"හා සරා. "
ඒ වන විටත් කෑම සාලයේ තිබූ මේසය මත තබමින් උන්නේ සරායා සහ ඇගේ අම්මාය.
මමත් සරාගේ පියාත් කෑම මේසයට වාඩි උනෙමු

.අම්මා සහ සරා  අඩුපාඩු සැපයූවාය .

"ඉතින් පුතා කොහොමද පාඩම් වැඩ එහෙම? "

සරාගේ පියා කන ගමන් විමසුවේය.

"හොඳයි අංකල් කෙරීගෙන යනව තව ඉස්සරහට තමයි වැඩ වැඩි වෙන්නෙ. "

"ඉගන ගන්න කාලේ මහන්සිවෙල ඉගන ගන්න ඕන. "

අපි කෑම කා අවසන් වන විට වගේම අයියා පැමිණියේය.

ටික වේලාවකින් අපි ඒමට ලෑස්ති උනෙමු අපි එනවිටත් වැහි පොද පටන් අරන් තිබිනි.

"කුෂාන් ඔයා ඩාන්සින් ඉන් ද රෙයින් කියන දේට ආසද? "

මම එලියට බසිද්දී සරා ඇසු දෙයින් හැමෝටම හිනා ගියෝය.

"මම කැමතියි සරා බට් දිස් ඉස් නොට් අ ටයිම් ෆොර් ඩාන්ස්. "

"ඉට්ස් ඔකේ කුෂී බට් අයි ලයික් දිස් ටයිම් ,ඉන්න කුඩයක් දෙන්න ඔයාට. "

KUSHAN HETTIARACHCHI

ඇය තුලට ගිහින් කුඩයක් ගෙනාවාය.

"නැත්තන් නැන්දම්ම මට දොස් කියයි ලෙඩ කලා කියල. "

ඇයපැවසුවේ මට විතරක් ඇහෙන්න හීමීටය.

"මැට්ටි වගේ මේ අලුත් වැස්සට තෙමෙන්නෙ නැතිව ගෙට වෙලා ඉන්නවද."

"හී. "

"පුතා ආයේ දවසක ඇවිත් යන්න, "

සරාගේ අම්මා වාහනයට ගොඩ වෙද්දී පැවසුවාය.

සරාගේ අයියා යන කම්ම කතා කලේ රටේ තොටේ වැඩ ගැනයි එයාගේ බිස්නස් වැඩ ගැනයි. තමයි එහෙත් වැදගත් දෙයක් ද කියවිනි ඒ සරාගේ විවාහය ගැනයි.

"මල්ලි ඒ ලෙවල්ස් වලින් පස්සෙ නංගිව ඉක්මනටම බන්දල දෙනව එයාගෙ මස්සිනාට. "

මගේ සිරුර පුරා සියුම් වේදනාවක් ගලා ගියේ සැනිනි.

"ඇ-යි- අයියේ එච්චර ඉක්මනින්. "

"ලොකු මහත් උන ගැහැනු ළමයි ගෙදර

තියාගත්තාම ප්‍රශ්න වැඩිනෙ මල්ලි ඒත් ප්‍රශ්නෙ තියෙන්නෙ සරායා තාම මේ කසාදෙට කැමැත්ත දීල නෑ. "

"එයා අකමැති උනොත් මේ කසාදෙ වෙන්නෙ නැද්ද? "

"කොහෙත්ම නෑ මල්ලි ගෑනු ළමය අකමැතිනම් ඒ කසාදෙ කෙරෙන්නෙ නෑ."

මගේ පපුවට නිකන් සීතල හුලන් පොදක් ගැසුවා වගේ ය.

"මම මල්ලිගෙන් අහන්න හිටියෙ ඔයා එයාගෙ හොඳම යාලුවනෙ ,"

"ඔව් අයියෙ. "

"සරාට බොයි කෙනෙක් එහෙම ඉන්නවද ඔයා දැනුවත්ව. "

"ම්ම් ඇයි අයිය එහෙම ඇහුවෙ. "

"නෑ මට සැකයක් තියනව එහෙම. "

"සැක හිතන්න හේතුව. "

"හේතුව ඉරිද  මම දැක්ක එයා කොල්ලෙක් එක්ක කැන්ටින් එකේ එකට කෑම කකා ඉන්නව මට

සරායා
Author
KUSHAN HETTIARACHCHI

කොල්ලගෙ මූණ  පෙනුනෙ නෑ පිටිපස්ස හරවල හිටි හින්ද එයත් ශෝල් එකෙන් මුහුණ වහ ගත්ත ඒත් ඉතින් මම දැක්ක පෙනුමෙ හැටියටනම් මුස්ලිම් කොල්ලෙක් නෙවෙයි. "

හ්ම්ම් ඔය පැන්නෙ බලල මල්ලෙන් එලියට මූ ගහන ගේම මට තේරුනි මෙයා මාව නොදැක තියෙන්න විදිහක් නෑ.

"අයියෙ මේ ඉරිදනම් බන්ඩයියගෙ කැන්ටිමට ගියේ මාත් එක්ක ඔයාට මාව අදුනන්න බැරි වෙන්න ඇති. "

සරාගේ අයියා මගෙ මුහුණ දෙස එක එල්ලෙ බැලුවේ ය.

"මම ඒක දැක්ක උඹෙ හොරයක් තිබුනනම් උබ ඔහොම කියන්නෙ නෑ මල්ලි උඹ මොකද කියන්නෙ බලන්න මම ඇහුවෙ. "

අපි බිහල්පොලට එන විට ඩේවිඩ් හන්දියේ හිටි නිසා මම එතනින් බැස්සෙමි.

සරාලගෙ අයියා වාහනය හරවන් ආපසු ගියේ මට වේව් එකකුත් දමාගෙනය.

"කව්ද බන් ඌ. "

ඩේවිඩ් ඇසුවේ යන කාර් එක දෙස බලමිනි.

"කවුරු කියලද හිතන්නෙ මගෙ අනාගත මස්සිනා බන්. "

"සරා ගෙ අයියාද ඌ කොහොමද සෙට් උනේ. "

"මම අද සරාලගෙ ගෙදර ගියා බන්. "

"අම්මද බොල උඹ එච්චර දියුනුයි දැන් නේද? "

"නෑ බන් වෙන වැඩකට ගියේ උඹට මම කියන්නම් කො මොකෝ අප්සෙට් එකේ වගේ. "

"නෑ බන් නිරාශා බෑ කියනව. "

"හේතුව. "

"ඒකිගෙ ගෙදරට මාට්ටු වගේ වැඩේ. "

"අපි හෙට ඉස්කෝලෙට ගියාම බලමු. "

"මම හෙට ඉස්කෝලේ එන්නෙ නෑ හවස උඹට කෝල් කරන්න හිටියෙ. "

"උඹ දැන් කොයි වෙලාවෙද ඕක දැන ගත්තෙ. "

"ඊයෙ හවස. "

"හ්ම්ම් උඹ කලබල වෙන්න එපා කෙල්ලො හරියට කාල ගුනේ වගේ බන්. "

මම ඔහුගේ පිටට තට්ටුවක් දමා ගෙදර එන්නට හැරුනෙමි .

"ඉදපන් මම උඹව ගෙදරට දාලා එන්නම්. "

ඩේවිඩ් කාරයට නැග එය ආපසු හරවා ගත්තේය.මම වාහනයට නැගුන පසු ඔහු ආවේ අපේ නිවසටය ඒ එනකම් ඔහු වචනයක් වත් කතා කලේ නැත .මාව බස්සවා ඔහු ගෙට වත් ගොඩ නොවී එහෙම්මම යන්න කාර් එක හරවා .

"මචන් උඹට පුලුවන්නම් හෙට නිරාශගෙන් මේ ගැන අහපන් ."

"ඕකේ මම අහන්නම් මචන්. "

ඩේවිඩ් පිටවූ පසු මම ගෙට ගොඩ වීමි .

"පුතා ඊයෙ ඉස්කෝලෙදි මොකද උනේ. "

සාලයේ පත්තරයක් බලමින් උන් අම්මා හිස ඔසවා ඇසුවාය .

ඒ ගමන මොකාද මේ සැරේ ගින්න දීපු එකා.

"මොකක්ද අම්මා. "

"අද වික්‍රමසිංහ මහත්තය ආවා තාත්තව හම්බෙන්න ඒ වෙලාවෙ කිව්වෙ ,කව්ද ඔය රංජන්

කියන්නෙ. "

"අම්මේ අර දවසක් ඇවිත් මෙහෙන් කෑම එහෙම කාලා ගියේ. "

"ආ එයා ද ?මොකද එයා ඔයවාගේ වැඩ කරන්නෙ? "

"අම්මා ඒක අහන්න ඕනෙ උගෙන්නෙ ,උඟ සරායා පස්සෙන් යනවනෙ. "

"ඔය සරායා කියන ගෑනු ළමය ඔච්චරම ලස්සනද? "

"ඔව් අම්ම එයා හුගක් ලස්සනයි ලස්සනටත් වඩා පුදුම ගතිගුණ තියෙන්නෙ. "

"ආ ඇත්තද ඒකට කමක් නෑ යාලුකම තිබ්බාම ඇති එතනින් එහා මුකුත් ඕනේ නෑ ,මට ඔයා ගැනත් නරක ආරංචි කීපයක් ම තියනව. "

"ඒ මොනවද අම්මා. "

මම ඇය ලඟින්ම ඉඳ ගත්තෙමි.

"ඇත්තද මේ ඉස්කෝලේ කෙහෙල්කන් කපනව කියන්නෙ. "

"දැන් ඕක කිව්වෙ කවුද? "

සරායා Author KUSHAN HETTIARACHCHI

"කිව්ව කෙනාගෙන් වැඩක් නෑනෙ හා හා නාගෙන කෑම කන්න. "

දැන් ඉතින් කොහාට කන්නද සරා ලගෙ ගෙදර ගියා කිව්වොත් දරු කමිනුත් අයින් කරල ගෙදරිනුත් එලවනව ශුවර්.

පසුවදා ඩේවිඩ් ආවෙ නැති නිසා මම තනිවම පාසැලට ගියෙමි .

මා යන විටත් සරා පැමිණ සිටියාය.

"ගුඩ් මෝර්නින්ග් කුෂාන්. "

"ගුඩ් මෝර්නින්ග් සරා. "

"ඊයේ මස්සිනා මොකද කිව්වෙ. "

ඇය ඇසුවේ සිනා සීගෙනය.

"මස්සිනා කිව්ව අද හෙටම උනත් කැමතිනම් අරන් යන්න කියල. "

"අනේ ඇත්තද එච්චර ලේසියෙන් ගෙනියන්න දෙයි කියල වෙන්න ඇති හිතේ. "

මා ඇයට කැන්ටිමේ සිද්දිය කීවෙමි.

"මොනවා අයියා දැකලද ?"

"හ්ම්ම් අවුලක් නෑ එයා දන්නව අපි ගැන මට

Author
KUSHAN HETTIARACHCHI

හිතෙන්නෙ. "

"මගෙ දෙවියනේ. "

"මේ ඒක නෙවෙයි නිරාශයි ඩේවිඩුයි තරහ වෙලා නිරාශා කියනව ලු නවත්තන්න ඕන කියල ."

"ඉතින් අපි මොකද ඒකට කරන්නේ කුෂාන් එයා කැමති නෑ කියනවනම් හෙතුව මොකක්ද? "

"ඒක දන්නෙ නෑ අපි බලමුකො. "

"අර ඉන්නෙ නිරාශා ඔයා නිකන් අහල බලන්න මම අහන එක හොඳ මදි මම එයා එක්ක එච්චරම ෆිට් නෑනෙ. "

"මම නිකන් අහල බලන්නම්. "

මම නිරාශා හිටි ඩෙස්ක් එක වෙතට ගියෙමි. පිසික්ස් පැක්ටිකල් එකක් එන්ටර් කරමින් උන් ඇය මා දෙස බලා සිනාසී.

"කුෂාන් ගුඩ් මෝර්නින්ග්. "

"ගුඩ් මොර්නින්ග් නිරෝ. "

මම අසල වූ පුටුවක් ගෙන අනිත්පැත්ත හරවා ඉද ගතිමි.

"කියන්න. "

ඇය පොත නවා තබා සිනාසී මගේ මුහුණ දෙස බැලුවාය.

"මොනවද කියන්නෙ. "

"එක්සෑම් වලට තව එච්චර කාලයක් නෑ නෙ කුෂාන් මම පුලු පුලුවන් විදිහට වැඩ ටික ඉවර කරනව ."

"ඒක හොදයි නිරෝ මම මේ ආවේ. "

"මන් දන්නව කුෂාන් ඔයා ආවේ ඩේවිඩ් ගෙ ප්‍රශ්නෙ ගැන කතා කරන්නනෙ. "

"ඔව් නිරෝ ඔයා කොහොමද එහෙම හිතුවෙ, මොකක්ද දැන් වෙලා තියෙන්නෙ නිරෝ. "

KUSHAN HETTIARACHCHI

"ඒක දිග කතාවක් මට වඩා ඔයා ඩේවිඩ් ගැන දන්නවනේ එයාලට සල්ලිවලින් කරන්න බැරි දෙයක් නැහැ අනික අපි බොහොම සාමාන්‍ය මිනිස්සු කුෂාන් අපි අපේ තරම දැනගෙන වැඩ කරන්න ඕනේ . "

"ඒක හරි නිරෝ ඔයාට ඕක ගැන හිතන්න තිබ්බෙ ඔය දෙන්න යාලුවෙන්න කලින් නෙ අනික දුප්පත් පෝසත් කම් ගැන හිතන එකටනම් මම විරුද්දයි .

"

"මම එහෙම හිතුවෙ නෑ හිතන්න උනේ එක සිද්දියක් හින්ද. "

"ඒ මොකක්ද නිරෝ."

"අපේ ගෙවල් ගාව කෙනෙක් එයාලගෙ ෆැක්ටරි එකක වැඩ කරනව එයා දවසක් මාවයි ඩේවිඩ්වයි ටවුන් එකෙදී දැකල ඒක එයාලගෙ තාත්තට කියල. "

"ඉතින් ."

"ඉතින් කියන්නෙ අපේ ගෙදරට කෝල් කරල හැමදාම බනිනව මේ සම්බන්දෙ නවත්තන්න කියල. "

"ඒකද මේ. "

"ඔව් මේක නැවැත්තුවෙ නැත්තන් ජීවිත කාලෙම විදවන්න වෙයි කියලත් කිව්ව,මට හරි බයයි කුෂාන් අපේ අම්මටයි තාත්තටයි ඉන්නෙ මම විතරයි මේ ප්‍රශ්නෙ හින්ද ඒ දෙන්නත් ලොකු පීඩනයක ඉන්නෙ අසරණ මිනිස්සු,අනිත් එක මේව ඩේවිඩ් ට කියන්න එපා . "

"ඇයි කියන්න එපා. "

"මේවා ඩේවිඩ් දැන ගත්තොත් ඒකත් බලා ගන්නම් කිව්ව ඔයා මේ දේවල් ඒ හින්ද කියන්න එපා ."

"ඕකේ මට අද හවස හම්බෙනව මම ශේප් කරන්නම් ඒත් ඔයා එක්සෑම් ඉවර වෙනකම් එයාට අප්සෙට් වෙන දෙයක් කරන්න එපා තේරුනාද?. ඔයා කියන්න ටවුන් එකේදි හම්බෙන්න බෑ කියල ඔයා මේක ප්‍රශ්නයක් කර ගන්න එපා මම ඉන්නවනේ මම හොද වෙලාවක් බලල අංකල් එක්ක කතා කරන්නම්. "

"එපා කුෂාන් අපි බලමුකො මොකද වෙන්නෙ කියල. "

මම ඇය ලඟින් නැගිට ආවේ පාසල ඇරබෙන සීනුව නාද වූ නිසාය.

එදින හවස පාසැල ඇරුණු පසු සරායත් මමත් පයින්ම බිහල්පොලට ආවේ පාස්පොර්ට් වලට ෆොටෝස් ගැනීමටයි. බිහල්පොල සුනිල් අයියාගේ ස්ටුඩියෝ එකෙන් ඒ වැඩය කරගත් අපි

චායාරූපත් රැගෙන හොරොම්බාව ප්‍රාදේශීය ලේඛම් කාර්යාලයට ගොස් පාස්පෝර්ට් ෆෝර්ම් දෙකක් ගෙන ආවෙමු .එළියට ආ පසු අප දෙදෙනා බසයක් එනතුරු බස් හෝල්ටෙකට වී කතා කරමින් සිටියෙමු .කුලියාපිටි බස් නම් කීපයක් ගියත් සරාව තනියම දමා ආ නොහැකි නිසා මම කැකුණගොල්ල බසය එන තෙක් ඇය සමගම රැඳී සිටියෙමි .විනාඩි විස්සකින් පමණ.කැකුණගොල්ල බසය පැමිනියෙන් සරා එයට නැගුනේ මට වේව් එකක් දමාගෙනය .

ඒ එක්කම පිටුපසින් ආ වැවගම බසයට මම ඇගුනේ එය බිහල්පොලින් හරවා යන නිසාය .

මම බිහල්පොලින් බැස පයින් යද්දී පත්තරක් කඩේ රංග අයියා එළියේ සිට මට කතා කළේය.

"කොහෙද නාරම්මල පැත්තට ගියේ මල්ලි? "

"ආහ් අයියේ ඒජීඒ ඔෆිස් එකට ගියා යාලුවෙක් ගෙ වැඩකට. "

රංග අයියා මගෙ බොක්කෙ යාළුවා අපි දෙන්න අතර රහස් නෑ ඒතරම් යාලුවෝ.

"මල්ලි මම පොඩි දෙයක් අහන්න හිටියේ. "

"මොකක්ද අයියේ. "

"මම කෙලින්ම අහන්නම්කො කවුද සරායා කියන්නේ ."

"ඔයා කොහොමද දන්නේ. "

"කැකුණගොල්ලෙනෙ ඔයා දන්නවනේ මේ ඒරියා එකේ හැම තැනම මම දන්නව කියල. "

රංග අයියලාගේ පත්තර බෙදා හැරීම වර්ග කිලෝමීටර් හතලිහක පමණ පැවතුන නිසා ඒ ප්‍රදේශය ඇතුලත බොහෝ අය ඔහු අඳුනයි.

"ඉතින් කියන්නකො. "

"කියන්න දෙයක් නෑ ඒ මොහොමඩ් අංකල්ගෙ දුව එයාගෙ අයිය ඉජාස් මගෙ ක්ලාස්මේට් ඔයා මේ ලඟදි එහෙ ගියානෙ නේද? "

"දැන් එතකොට අයිය මට මක් කරන්න කියලද කියන්නෙ. "

"මුකුත් කියන්නෙ නෑ උදව්වක් ඕන උනොත් කියන්න මුස්ලිම් උනත් හොඳ ෆැමිලි එකක් ,හැබැයි ලේසි වෙන්නෙ නෑ ඉතින්. "

"ඔව් අයියා ඒක මම දන්නව ඒත් ආදරේට ජාති ආගම් භේද නෑනේ. "

"ඔව් ඒ ඔයා හිතන විදිහ මල්ලි ,දැන් ගෙදරද යන්නෙ "

"ඔව් අයියේ ."

"ඉන්න මම කමිසයක් දාන් එනකම් මම ගිහින් දාන්නම්. "

ඔන්න ඔහොමයි රංග අයියා මගෙයි සරාගේයි අෆයාර් එක දැන ගත්තෙ .

මාව ගෙනත් දා රංග අයියා ගියේ අපේ දිහයින් තේත් බීමෙන් පසුවය.

රෑ මම ඇප්ලිකේශන් එක පිරෙව්වෙමි අම්මා ඒ දෙස බලා.

"පුතා මොකක්ද ඔය? "

"අම්මා මේ පාස්පෝර්ට් ඇප්ලිකේශන් එකක් ඒ ලෙවල් ලියල මම ඉන්දික අයිය ගාවට යන්න හිතුව එයා එහෙ ජොබ් එකක් හොයල දෙන්නම් කිව්ව. "

"ඔයා ඒ ගත්ත තීරණය හුඟක් හොදයි. "

"ඇයි අම්මා "

"නැත්තම් ඔයා මොනවයින් මොනව කර ගනියි ද දන්නේ නෑ. "

කියමින් නිවසේ පිටුපසට ගියාය .

ඒඑක්කම වගේ ගෙදර ටෙලිෆෝන් එක නාද වූයෙන් මම රිසීවරය එසවූයෙමි .

කතා කරණ විදිහෙන් නම් සිංහල කෙනෙක් නෙවෙයි වගේ තේරුනි.

"හෙලෝ මේ කුෂාන් ලගෙ ගෙදරද? "

"ඔව් කව්ද මේ? "

"මම සබ්‍රිනා සරායගෙ යාලුවා. "

"ආ සබ්‍රි කියන්න මොකද හදිස්සියේ. "

"කුෂාන් සරායට කතා කරන්න ඕනලු මම ෆෝන් එක දෙන්නද? "

"ආහ් දෙන්න දෙන්න. "

"කුෂාන් අරකෙ සමහර තැන් පුරවන්න තේරෙන්නෙ නෑ මට. "

"කමක් නෑ ඔයා පුලුවන් හරිය පුරවගෙන එන්න ඉතුරු ටික අපි ඉස්කෝලෙදි කරමු. "

මට තව කෙනෙක් තදින් හුස්ම ගන්නවා ෆෝන් එක තුලින් ඇසුනි වැඩේ හරි අම්මා කුස්සියේ ෆෝන් එකෙන් කෝල් එක අසාගෙන සිටින හැඩයි.දැන් මෙයා පාස්පෝර්ට් යයි පැවසුවොත් ඔක්කම වතුරේ ඒ නිසා මම.

"මම ඔයාට කතා කරන්නමයි හිටියෙ සරා අපේ අර ගෘප් ප්‍රොජෙක්ට් එක දැන් පටන් ගන්න කාලේ හරි. "

සරාටත් වැඩේ තේරුනා සේ ය.

"ඔව් අපි හෙට මේ ප්‍රැක්ටිකල් ටික එන්ටර් කරලා ඒ ගැන බලමු එහෙනම් මම තියන්නම් කුෂාන් ගුඩ් බායි බුදුසරණයි. "

"ගුඩ් බායි බුදුසරණයි. "

මම රිසීවර් එක තබා කෑම කාමරයට ගියේ කුස්සියේ තත්වය බලා ගැනීමටයි .

අම්මා සිනා මුසු මුහුණින් එලවලු වගයක් සුද්ද කරනු දුටුවෙමි.

"පුතා. "

මම එතනින් යන විට අම්මා කතා කලාය.

"ඇයි අම්මා."

"දැන් කතා කලේ කව්ද? "

"ආ අම්මා ඒ සරායා අර ප්‍රැක්ටිකල් එකක් එන්ටර් කර ගන්න හැටි අහන්න කතා කලේ. "

"ඒ ළමය ෆෝන් එක තියද්දි ඇයි බුදු සරණයි කියන්නෙ. "

"ආහ් ඒ එයාගෙ හැටි අම්මා. "

"මට ඒ ළමයව දකින්න ආසයි. "

යකෝ අම්මා මේ මොකාටද එන්න යන්නෙ.

"අම්ම කෝල් එක අහන් හිටිය නේද? "

"හ්ම් ඔව් මම අහන් හිටිය. "

"අම්මා මම සරායට ආදරෙයි තමයි ඒත් අපිට යන්න පුලුවන් යාලුවො කියන තැනට විතරයි. "

මම කුස්සියේ තිබූ පුටුවේ ඉදගනිමින් පැවසුවේ අම්මාගේ මුහුණ බලාගෙනයි .

"පුතා කාටද මේ බොරු කරන්නේ ඔයාට දැන් තියෙන්නෙ ගෑනු හොයන එකද? නැත්තන් ඉගන ගන්න එකද? "

ඇයි අම්ම ඕහොම කියන්නෙ.

අර ඔයාගෙ පන්තියේ ළමයෙක් මට කෝල් කල දවසෙම අක්කත් ඔයාව කුරුණෑගලදි දැකල තියනව.

මල සේකරයි මේ ගොබ්බි කොහෙ ගිහින්ද? මගෙ අක්ක නිශානි එයා මැරි කරල ඉන්නෙ කුරුණෑගලට කිට්ටුවමයි.

"හරි මම අම්මට ඇත්තම කියන්නම් සරායා කියන්නෙ මගෙ ක්‍රශ් එක මම මැරිකරොත් මැරි කරන්නෙ එයාව විතරයි එයත් එහෙමයි. "

"ආ ඔය පැන්නෙ බළල මල්ලෙන් එළියට ,එකක් මතක තියා ගනින් පුතා උඹෙ හිතේ තියන දේවල් ඉෂ්ට වෙන්නෙ නෑ තම්බි කෙල්ලක් කවදාවත් මේ ගෙදර ලේලි වෙන්න බෑ."

"අම්මේ ඒවට තව කල් තියනව අම්ම ඕනවට වඩා කලබල වෙනවනෙ මුස්ලිම් දෙමල සිංහල අපි ඔක්කොම මිනිස්සු. "

මම පුටුවෙන් නැගිට මගේ කාමරයට ආවෙමි.

දැන්නම් යුද්දය හොඳටම ඇවිලෙන්නයි යන්නෙ මට මෙහෙමනම් සරායාට මේක දැනගත්තොත්

KUSHAN HETTIARACHCHI

ගෙදරින් කොච්චර ප්‍රශ්න ඇතිවෙයි ද ?

*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-

පසුදා උදෑසන පාසලේදී සරායත් මමත් පාස්පෝර්ට් ඇප්ලිකේශන් දෙක පිරවීමු ඉන්පසු ෆෝර්ම් දෙකම මම ඉංග්‍රීසි අච්චු පොත අස්සේ දැම්මෙමි.

"සරා මේක සාම විනිසුරු කෙනෙක් අස්සන් කරන්න ඕනේ. "

"ඒකට මොකද කරන්නෙ කුෂාන්. "

"මම අපේ නක්කවත්ත පන්සලේ ධම්මසිද්දි හාමුදුරුවන්ගෙන් අහල බලන්නම් මගෙ එක නම් ප්‍රශ්නයක් වෙන්නෙ නෑ ඔයාගෙ එක තමයි ඒත් මම හිතනව පුලුවන් වෙයි. "

"කුෂාන් අපි දෙන්න මේ කරන්න හදන වැඩේ හරිද දෙමව්පියො රවට්ටන එක හොඳ නෑ නේද? "

"මම ඔයාට ආදරේ කරනව කියල ගෙදරට කිව්ව. "

"මොනව අම්ම මොකද කිව්වෙ. "

"අම්ම ටිකක් බැන්න. "

"කුෂාන් මමත් අයියට ඔයා ගැන කියල

තියෙන්නෙ. "

"මොනව අයියා මොනවද කිව්වෙ. "

"අයිය මට හරිම ආදරෙයි අයියා මුලින් ටිකක් බැන්න ඒත් පස්සෙ ශේප් "මගෙ බෝනික්කිව මම බලාගත්ත වගේ ආදරෙන් බලා ගන්න කෙනෙක් නම් කමක් නෑ කිව්ව " මොකද එයත් මස්සිනාට කැමතින් නෑ එයා අයියටත් වඩා වයසයි එයාගෙ කල් ක්‍රියාවත් එච්චර හොඳ නෑ තාත්ත මස්සිනාට කැමති එයාගෙ අක්කගෙ පුතා හින්ද? "

"මස්සිනා මොනවද කරන්නෙ. "

"එයාට බිස්නස් ගොඩක් තියනව ඕන තරම් සල්ලිත් තියනව. "

"එකක් මතක තියා ගන්න මම මැරුනත් ඔයාව අත හරින්නෙ නෑ. "

මම ඇගේ අත අල්ලා ගනිමින් පැවසුවෙමි.

"මම දන්නව බබා ඒක. "

"මගේ ළමැද සුව යහනක් ඔබට සදා දෙන්න කියා .."

කව්ද යකෝ පසුබිම් සංගීතය දෙන මියුසික්

Author KUSHAN HETTIARACHCHI

ඩිරෙක්ටර්  මම එක පාර ආපසු හැරුණේමි.

අපේ නුවන් මා පිටුපස සිටියේය.

"මචන් උඹල දෙන්න වැදගත් කතාවක් ද? "

"නෑ කියපන්. "

"මචන් මට තියනවනම් රුපියල් සීයක් දියන්. "

"ඒ මොකටද මචන්. "

මම ඔහුට රුපියල් සීයක් දෙමින් ඇසීමි.

"මචන් මම පර්ස් එක දාල ඇවිත් අද උදේට කෑවෙ නෑ හවස යන්න සල්ලිත් නෑ "

"නුවන් ඔයා අපිත් එක්ක කන්න කැමතිනම් මගෙ කෑම එක තියනව. "

සරායා පවසද්දී.

නුවන් මගෙ මුහුණ දෙස බැලුවේ දෙගිඩියාවෙනි .

"වරෙන් බන් ."

කියා අතින් ඇද ඔහුව අසල පුටුවකින් ඉන්දවා අපි තුන්දෙනාම සරායාගේ කෑම එක කෑවෙමු .

"සරා හරිම රසයි කවුද කෑම ඉව්වෙ. "

Author
KUSHAN HETTIARACHCHI

මම අසද්දී.

"මමයි අම්මයි තමයි උදේ උයන්නෙ. "

"අපේ කුෂාට සස කෑම වලින් අඩුවක් නැතිවෙයි නේ බැන්ද දාට. "

නුවන් පැවසුවේ සරාගේ මුහුණ දෙස බලමිනි.

"දැනටත් ඒකේ වෙනසක් නෑ නේද සරා. "

මම සරා දෙස බලමින් පැවසීමි.

"ඒකනෙ කුෂාන් "

එදින සවස මම අපගේ පන්සලට ගියේ අපගේ පාස්පෝර්ට් ඇප්ලිකේශන් දෙක හාමුදුරුවන්ට කියා සහතික කර ගැනීමටය.

මම උන්වහන්සේ වැඳ පසෙකින් හිද ගත්තෙමි.

"ඉතින් මහතා කොහොමද තොරතුරු තාත්ත එහෙම ගෙදරද? "

"ඔව් අපේ හාමුදුරුවනේ. "

"මොකද තකහනියක් මේ පැත්තෙ. "

"අපේ හාමුදුරුවනේ මේ පාස්පෝර්ට් ඇප්ලිකේශන් දෙකක් සහතික කර ගන්න."

"කෝ බලන්න ගම්මු. "

"අනිත් එක කාගෙද? "

"මගෙ පංතියේ යාලුවෙක් ගෙ හාමුදුරුවනේ. "

"එයා නැතිවනම් මේක මට අත්සන් කරන්න බැහැ ඒත් මහත්තය හින්ද මම අත්සන් කරන්නම් මහත්තය මෙයාව හොඳටම දන්නව නේද? "

"ඔව් හාමුදුරුවනේ මම දන්නව. "

මම පංසලේ සිට එන විට බොහෝ හවස් වී තිබුනි.

මා වාහනයෙන් බැස ගෙට ගොඩවෙන විටම සාලයේ සිටි තාත්තා..

"කුෂාන් ඔහොම ඉන්නව. "

තාත්තා මගේ නම කියා කතා කරන්නේ කලා තුරකිනි එත් මා සමග අමනාප වූ විටකදීය.

"ඇයි තාත්තා. "

"ඇයි තාත්තා නෙවෙයි මොකක්ද මේ තම්බි කෙල්ලක් එක්ක නටන නාඩගම. "

"තාත්තට කව්ද ඔ්වා කිව්වෙ අම්මද? "

"අම්ම කිව්වනම් දුක නෑ මට නිෂා කෝල් කරල

කිව්වෙ ,මීට පස්සෙ උඹට මේ ගෙදර වාහන අල්ලන්න තහනම්. "

"වාහන, මට ඕනේ නෑ වාහන මෙන්න තියා ගන්න. "

මම කාරයේ යතුර සාලයේ තිබූ කෑම මේසය මතට විසි කලෙමි.

"මුං හැදිල ඉවරයි කරදඬු උස් වෙනකොට එනව කරේ නගින්න මම හොයා ගන්නම්කො ඔය තම්බිච්චි කවුද කියල. "

"තාත්තා ඔයා වලිගෙ පාගගෙන ඉන්නෙ අපි අතර එහෙම සම්බන්දයක් නැහැ ශී ඉස් ජස්ට් අ ෆ්‍රෙන්ඩ් තත්තා. "

"වලිගෙ පාග ගන්න උඹ හිතුවද උඹෙ තාත්තත් උඹ වගේ වඳුරෙක් කියල. "

තාත්තා එය කිව්ව හැටියට මට බකස් ගා හිනා ගියේය.

"චූටි උඹ මොකද හිනා වෙන්නෙ ඒ ගමන. "

"නෑ ඉතින් මම වඳුරනම් තාත්තා නිකම්ම වඳුරු තාත්ත වෙනවනෙ. "

Author
KUSHAN HETTIARACHCHI

"උඹේ කටනම් තියනව වක්කඩ වගේ ඉදගනින් ඔය පුටුවෙන් මට ටිකක් කතා කරන්න ඕන. "

"ඇයි තාත්තා? "

මම තාත්තා ඉස්සරහ තිබු පුටුවෙන් වාඩි වෙමින් ඇසුවෙමි.

"කවුද ඔය කෙල්ල? "

"මොන කෙල්ලද? "

"මේ උඹ අම්මටයි අක්කටයි ගාන බටර් මට ගාන්න හදන්න එපා ඇත්ත කතා කරපන්. "

"ඝාතිමා සරායා මොහොමඩ් මම ඒ කෙල්ලට ආදරේ කරනව තව වෙන මොනවද දැන ගන්න ඕනේ තාත්තට. "

"කියන ලස්සන විතරක් උලම වගේ. "

"ඇත්තටම තාත්ත උලම ව දැකල තියනවද? "

මම එහෙම ඇහුවේ උලම කියන සතාව මම දැක නොමැති නිසාය .

"ඔව් උඹ දැකල නැත්තම් අර උඹේ කාමරේ තියන කන්නාඩිය ඉස්සරහට ගිහින් බලපන් එතකොට පෙනෙයි. "

"හා තාත්තේ මම බලන්නම්. "

මම නැගිට්ටින්න හැඩුවෙමි .

"නෑ නෑ ඉඳගනින් මගෙ දේශනාව තාම ඉවර නෑ මේ මේ මොනවද ඔය අතේ තියෙන්නෙ. "

හුටා පාස්පෝර්ට් ඇප්ලිකේශන් දෙක.

"මෙහාට ගනින්. "

තාත්තා ෆෝර්ම් දෙක මගෙ අතින් ඇද වගේ ගත්තේය.

"ෆාතිමා සරායා මොහොමඩ් උඹ දැන්ම ඒ කෙල්ලවත් අරන් රට පනින්නද යන්නෙ. "

"අයියෝ තාත්තා පාස්පෝර්ට් හැදුව කියල රට යන්නම නෙවෙයිනෙ. "

"එහෙනම් බස් එකේ යන්න වෙන්න ඇති ... මේ අහපන් චූටි උඹේ වයස මම පහු කරේ හුඟක් කාලෙකට කලින් මම දන්නව උඹ හැරෙද්දී ගොනා හැරෙන්නෙ පොල් පැලේ කන්න කියල උඹට මේ කෙල්ල මැරිකරන්න පුලුවන් එත් මගෙ බිස්නස් වත් දේපළවලවත් උඹට ලැබෙන්නෙ නෑ. "

"ඕකේ තාත්ත මට ඔයාගෙ බිස්නස් ඕනෙ නෑ ඒවා

අර ඔයාගෙ සුදු දුව අර කේලම් මල්ල ආන්න එයාට දෙන්න. "

මම පුටුවෙන් නැගිට තාත්තාගේ අතින් ෆෝර්ම් දෙක උදුර ගෙන වගේ ගෙන කාමරයට ගියෙමි .

පසුව දා සරාත් මමත් යලි ඒ ජී ඒ ඔෆිස් එකට ගොස් ඇප්ලිකේශන් බාරදී මුදල් බැද ආපසු නිවසට ආවෙමු .

මට ඩේවිඩ් යලි හමු උනේ සෙනසුරාදා උදේ ක්ලාස් යද්දීය ඔහු උදේම අපේ දිහා ආවෙන් අපි දෙදෙනා කුරුණෑගල ආවෙමු .තවත් වෙලාව තිබුනෙන් අපි කෑම කෑමට රජපිහිල්ල පාර්ක් එකට ගියෙමු .සමහර දවස් වලට ඩේවිඩ් ගේ මව මටත් එක්ක උදේ කෑම එවයි .අපි කෑම එක දිග හැරියා පමණි .

"අනේ මහත්තයා මම දවස් දෙකකින් කෑම කාලා නෑ මට කන්න මොනව හරි. "

ඇත්තම කියනවනම් මටනම් ටිකක් මල පැන්න ඇයි උදේට කාලත් නැතුව බඩගින්නෙ.

ඩේවිඩ් එක පාරටම

" හරි ඔයා මේ කෑම එක කන්න. "

කියමින් එතනින් නැගිට්ටෙය.

අපි දෙදෙනාම අසල වූ ටැප් එකෙන් අත සෝදාගෙන එන්න හැරුණ පසු දුටු දෙයින් ඩේවිඩුත් මමත් ගල් ගැසී සිටියෙමි.

"මචන් අර නිරා නේද යන්නෙ. "

ඩේවිඩ් අසද්දි.

"ඔව් මචන් ඒත් ඇයි අඬඅඬ යන්නෙ. "

"අනේ මංද බන්. "

"ඉදපන් මම ගිහින් බලන්නම්. "

මම දුවගෙන ගොස් නිරාශා ගේ ඉස්සරහට ගොස් මුහුණට එබුනි.

"නිරෝ ඇයි මේ අඬන්නෙ."

"නැහැ කුෂාන් මුකුත් නෑ. "

"මුකුත් නැත්තන් ඇස්වල කඳුලු ඇයි. "

"ඩේවිඩ් ගේ තාත්තා ..."

"ඔව් මොකද මට කියන්න. "

"එයා ටවුන් එකේ රැකගෙන ඉඳල මට හොඳටම බැන්නා. "

"මොනව ඔයා කොහොමද දන්නේ ඒ අංකල් ම කියල. "

මගේ ඒ ප්‍රශ්නයෙන් ඇය ගොලු වූ සෙයකි.

"ඉතින් එයාමනෙ කිව්වෙ. "

"අනේ ගොන් වැස්සි ඩේවිඩ්ගෙ තාත්තා ලංකාවෙත් නෑ මේ දවස් වල චයින වල බිස්නස් වැඩ වගයකට ගිහින් කතා කරපු කෙනා කොයි වගේද? "

"කලු මහත කෙනෙක්. "

"පිස්සුද අනේ අංකල් කලු නෑ මොකේද ඇවිත් හිටියෙ වාහනේ නොම්මරේ මතකද? "

"වාහනේක නෙවෙයි පයින් ඇවිත් හිටියෙ. "

"පයින්.. ඔයා හිතුවද ඩේවිඩ් ගෙ තාත්ත පයින් යනව කියල එයා යන්නෙ වාහනේ විතරයි. "

"එතකොට මේ කව්ද?"

නිරාශා ඇසුවේ කට අයාගෙනයි.

"ඒ ඉතින් මොන හාල්පාරුවෙක් ද දන්නෙ නෑ. "

ඒ අතරේ ඩේවිඩ් අප ඉන්න කිට්ටුවටම ආවෙන්.

සරයා Author KUSHAN HETTIARACHCHI

"මචන් උඹට තාත්තල දෙන්නෙක් ඉන්නවද? "

"මොකක් මොකක්ද ඒ වදුරු කුනුහරපෙ? "

ඩේවිඩ් ඇසුවේ නිරාශා දිහා බලාගෙනයි.

"නෑ ඉතින් උඹලගෙ තාත්තා සති තුනකට චයින ගියානේ. "

"ඔව්. "

"මේ අද උදේ ප්ලේන්ටියක් ගහන්න කුරුණෑගල ආපු ගමන් නිරෝ ට බැනල ගිහින්."

"මොනව චයින ගිය ඩැඩා උදේ කුරුණෑගල ඇවිත් ප්ලේන්ටි ගහන්න. "

"මචන් කවුරු හරි ප්ලෑනක් ගහනව උබලව වෙන් කරන්න බලමු මොකාද කියල. "

මුන් දෙන්නව ආයේ එකතු කරන්න මේ තරන් හොද වෙලාවක් ආයේ එන්නෙ නෑ.

"නිරෝ ඩේව් උඹල වෙන එවුන්ගෙ රෑකඩ වෙන්න එපා ලව් එක හරියට කරපල්ල බෙල්ල උනත් දෙන්න මම ඉන්නවනෙ. "

"ඔයා බෙල්ල දුන්නාම මට මොකද වෙන්නෙ මගෙ ටෙඩියෝ. "

සරායා..... මම තත්පරෙන් හැටෙන් එකකක වේගයෙන් ආපසු හැරුනෙමි .

ඇස්වලිනුත් සිනා සෙමින් බලා සිටියේ වෙන කවුරුත් නෙවෙයි මගෙ පන සරායා

"ඔයා මගෙනෙ පන. "

මම සරා ගාවට ගියෙමි.

"ඩේවිඩ් ඔයාලා යනවනම් යන්න මම  සරා එක්ක එන්නම්. "

"අපි කොහොමත් යනව නේ ඩේව්. "

නිරෝ කීවේ ඩේවිඩ්ගේ අත අල්ලන ගමන් මයි .

"හ්ම්ම් අපි ගියා "

ඩේවිඩ් සහ නිරාශා ගිය පසු.

"මේ ඔයාලා කෑවද? "

සරා අසද්දී.

"කෑවේ නෑ කන්න නැති මනුස්සයෙකුට කෑම එක දුන්න. "

"එහෙනම් මගෙ බත් එක කාලා යමුද? "

Author KUSHAN HETTIARACHCHI

"කෝ අද ඔයාගේ පාප මිතුරියො දෙන්න.?"

මම අසද්දී.

"අනේ ඇයි එයාලට එහෙම කියන්නෙ පව් නේ. "

අපි දෙදෙනා රජපිහිල්ල පාර්ක් එකට ගිහින් සිමෙන්ති බංකුවක් මත හිදගෙන කෑම කෑවෙමු .

"ILETS වලට කෙනෙක් හම්බුනාද කුෂාන්. "

"එක්කෙනෙක් නම් ඉන්නව "මහේන් ඒකනායක "කියල මම එයාව කතා කරල බලන්නම්. "

"ඉරිදට දා ගන්න පුලුවන් වෙයි නේද? "

"මම කතා කර ගන්නම්. "

"මම ඔයා දුන්න නෝට්ස් නම් බැලුව ඒවා තේරුම් ගන්න අමාරු නෑ."

"අපි කොහොම හරි ගොඩ යමු සරා මටනම් තාත්ත කිව්ව ඔයා ව මැරි කලොත් කිසිම දෙයක් දෙන්නෙ නෑ කියල. "

"අනේ කුෂාන් මට දුකයි බබා අපි මේක පටන් නොගෙන ඉන්න තිබ්බේ. "

"පිස්සුද සරා ඔයයි මමයි මේක පටන් ගත්තේ ඔය

Author
KUSHAN HETTIARACHCHI

ප්‍රශ්න එනව කියල නොදැන නෙවෙයි නේ අපි පටන් ගත්ත දේ අවසාන වෙනකම් කරමු. "

අනිවාර්යයෙන්ම මම ඔයත් එක්ක ඉන්නව .

*-*-*-*-*-*-*-*-*-*-*-*-*-

දවසක් ජිම් එකේ දී නියාස් අයියා මා දැක.

"කුෂාන් මල්ලි මෙහෙ වරෙන්කෝ ."

"ඇයි අයියේ. "

අසමින්ම මම ඔහු ලඟට ගියෙමි නියාස් යනු මුස්ලිම් උනත් අපිත් එක්ක බොක්කෙන් හිටි යාලුවෙකි.

"කවද්ද බං වෙඩ්ඩින්ග් එක? "

"කාගෙද නියාස් අයියා? "

"උඹෙයි අපේ ඉජාස් ගෙ නංගිගෙයි. "

"අපෝ කෑ ගහල වන කරන්න එපා. "

"හරි හරි ඉජාස් හොඳ එකා ඒත් තාත්තනම් අමාරුකාරය අවුලක් නෑ ප්‍රශ්නයක් උනොත් එක කෝල් එකක් ගහපන් මට,උඹ ලඟ අපේ ගෙදර නොම්මරේ තියනවනෙ. "

"අනිවා නියාස් අයියා ප්‍රශ්නෙකට තියෙන්නෙ සරාගෙ මස්සිනා ඉම්රාන්. "

"උඹ ඒක ගනන් ගන්න එපා උං මොකෙක්ද බන් උඹ එක්ක තිබ්බහම මටනම් උං පේන්න බෑ හනීෆා අංකල් මොන මගුලකට අර මලක් වගේ කෙල්ල උංට දෙන්න හදනවද මන්ද උං මෝඩ මැන්ටලයක් නෙ. "

"අනේ මංද නියාස් අයියේ ඒත් මම සරාව මැරුණත් අත හරින්නෙ නෑ. "

"ඒ කියන්නෙ උඹ ඒ තරම් සීරියස්. "

"ඔව් නැතුව . මම ඒකිට ආදරෙයි කිව්වෙ දාලා යන්න නෙවෙයි. "

"නියමයි කොල්ලො අපේ කෙල්ලව හැමදාම හොදින් බලා ගනින්. "

නියාස් කිව්වෙ මගෙ සුරත තදින් අල්ලා ගනිමිනි .

"අනිවා අයියේ. "

"ඉජාස් උනත් උඹ ගැන පැහැදීමෙන් ඉන්නෙ ගැටලුව තියෙන්නෙ අපේ ආගම් වෙනස් කම තමයි."

"අපි කවුරුත් මිනිස්සු අයියේ අපි ඒ තැන ඉඳල හිතනවනම් මේ ප්‍රශ්න එච්චර දරුණු නෑ. "

"උඹ හරි බන්. "

*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*

මෙලෙස මාස කීපයක් ගත විය

අපි උසස් පෙලට මෙන්ම ILETS වලටද පන්ති ගියෙමු .මහේන් ඒකනායක අපව විභාගයට සූදානම් කලේය උසස් පෙලට තව ඇත්තේ මාස දෙකකි මේ අතර සරායාට ගෙදරින් ආ බලපෑම් ටික ටික වැඩි වෙන්න විය .

දවසක් ඉජාස් අයියා සහ නියාස් අයියා අපේ ගෙදර ආවෝය.නියාස් අයියා අපේ ගෙදර නිතර එන නිසා අපේ ගෙදර අයට එය අමුත්තක් වූයේ නැත.

"මල්ලි මම ඔයයි නංගියි ගැන හැමදේම දන්නව. "

ඉජාස් අයියා කතාව පටන් ගත්තේය.

"මන් දන්නව අයිය දන්නව කියල. "

"ඔය දෙන්න රට යන්න ප්ලෑන් කරනව කියන එකත් මම දන්නව ඔයාලට සල්ලි කොහෙන්ද

හොයා ගත්තේ ඔවට. "

"අයියේ මම සරා මැරිකරනව කියන දා ඉදල මට අපේ බිස්නස් වලින් ආව ශෙයාර්ස් ඔක්කම නැවතුනා ඒත් මගෙ අතේ සල්ලි ටිකක් තිබ්බ අපි දෙන්න කොහොම හරි පිරිමහ ගන්නව ඉංන්ග්ලන්ඩ් ගියාට පස්සෙ අපිට කොහොම හරි ඔලුව උස්සන්න පුලුවන් වේවි. "

"මල්ලි. "

ඉජාස් අයියා ආයෙත් කතාව පටන් ගත්තේය .

"මට හොදටම විශ්වාසයි නංගිට හරියන එකම පිරිමියා ඔයා මේ නංගිගෙ බැංකු පොත මෙතන ලක්ශ දහයක් තියනව මේ සල්ලි නංගි නමින් මම එකතු කරපුව. ඔයාල යන වැඩේට මේ සල්ලි තියා ගන්න දැන් කවද විතරද ෆ්ලයි කරන්න තියෙන්නෙ. "

"අයියා සැප්තැම්බර් පහ තියෙන්නෙ අගෝස්තු 28 එක්සෑම් ඉවරයි අපි සැප්තැම්බර් එක මැරි කරණව මේව දන්නෙ අපි කීප දෙනෙක් විතරයි. "

ගෙදර වැඩට සිටින සුමනා කෝපි ගෙනාවයින් ඒ කතාව නතර විය.

*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*

කාලය ගලා ගියේ ඉක්මනිනි ඒ කාලය තුල තාත්තා නම් වචනයක් වත් මා සමග කතා නොකළ තරම් ය. මුලදී අකමැති උනත් දැන් අම්ම සරායාට අකමැත්තක් නොපෙන්නුවාය.උසස් පෙලත් අවසන් විය. යහලුවන් මුනගැසෙන අවසාන දවසයි අපි කතා කරමින් සිටි තැනට ආවේ රංජනුයි.

"කුෂාන් මට උඹත් එක්ක පොඩ්ඩක් කතා කරන්න පුලුවන් ද? "

"පුලුවන් මොකද මම ගොලු වෙලා හිටියෙ නෑ. "

"උඹටයි සරායටයි වගේම ඩේවිඩ් ටයි නිරාශටයි මම ගොඩක් වැරදි කලා ඒවා අමතක කරල දාන්න."

"මට නම් ඒවා අමතක වෙන්නෙ නෑ රංජන් අනික ඉස්සර වගේ ෆිට් එකකුත් උඹ එක්ක ඇතිවෙන්නෙත් නෑ. "

මම කෙලින්ම කීවෙමි. නයින්ට කිරි පොවල නිකන් කෙලව ගන්න ඕනේ නෑනේ.

සැප්තම්බර් එක උදේ කතා කරගත් ලෙසම අපි

විවාහයට සූදානම් උනෙමු .

ඒ දින පිටත් වීමට සූදානම් ව අම්මා වෙතට ගියෙමි.

තව විශේෂ දෙයක් සිදු විය මම උදේ පිටත් වීමට ප්‍රතම අම්මාගේ දෙපා වදින්නට කාමරයට ගියෙමි. ඒ මොකද මට මේ ලෝකේ සිටින උතුම්ම වස්තුව මගේ අම්මා නිසා ඇයට නොකියා මම කිසි දෙයක් කරන්නෙ නැත. මා යන විට අම්මා මගුල් ගෙදරක යන්න මෙන් හොඳට හැඳ පැලඳ සිටියාය .

"අම්මා කොහෙද යන්න හදන්නේ. "

"ඔයාට මොකටද ඒ වගක් මම මගෙ පුතාගේ වෙඩින් එකට යන්න හදන්නෙ. "

"මොනවා අම්ම එනවද? "

මම අම්මාව වැලඳ ගත්තෙමි.

"අම්මා විතරක් නෙවෙයි තාත්තත් එනව පුතා තාත්තටත් කතා කරන්න මේවා මෙහෙම වෙන්න තිබුන දේවල් නෙවෙයි. "

මම ඒ වන විටත් අම්මාගේ කාමරයට ආ තාත්තා දෙස හැරුනි කලකට පසු ඒ මුහුණේ සිනාවක් රැඳී තිබේ එය අව්‍යාජ්‍ය සිනාවකි මම තාත්තා ලඟ දනින් වැටුනෙමි.

"නැගිටපන් චූටී පරිස්සමින් පලයන් මමයි අම්මයි අක්කල එක්ක එන්නම් අර ළමයි අතන රස්තියාදු කරන්න හොඳ නෑ. "

මමයි ඩේවිඩුයි ගිහින් ටික වෙලාවකින් ඉජාස් අයියා සරායා සමග විවාහ රෙජිස්ටාර් තුමිය වෙත පැමිණියේ කාරයෙනි විවාහ ලේකම් තුමිය සූදානම් වෙන තෙක් අපි එළියෙන් වාඩි වී උන්නෙමු. සරායා හැඳ සිටියේ ලස්සන සල්වාරියකි .මද වේලාවකින් අක්කලාගේ වාහනය එනු දුටු සරායාගේ මුහුණ විසල් විය.

"කුෂාන් ඔයාලගෙ තාත්තා."

වාහනයෙන් බැස්සෙ අම්මා තාත්තා අක්කා මස්සිනා සහ රංග අයියා අප වෙත ඇවෝය.

"ඔයා බය වෙන්න එපා එයාලා එන්නෙ අපේ වැඩේට. "

"මොනවා ?"

"ඔව් සරා. "

ඒ එක්කම වේගයෙන් පැමිණියේ නියාස් අයියාගේ ඩොල්ෆින් වෑන් එකයි.

වාහනයෙන් බැස්ස නියාස් අයියා ඉජාස් අයියා

වෙත ආවේ.

"අපි පරක්කු නෑ නේද? "

"නෑ නෑ වෙලාවට ආවේ. "

වාහනයෙන් බැස්ස අනිත් කට්ටිය දැක්ක මට ඇඟ සීතල විය.

සරායාගේ අම්මා තාත්තා සහ තව මුස්ලිම් අය කීප දෙනෙක් බැස්සෝය .

ඔවුන් පැමිනියේ සිනා සෙමිනි.

මේ සැමදේම කර තිබෙන්නෙ ඉජාස් අයියා සහ රංග අයියා විසිනි ඔවුන් නිසා මාගේ විවාහය සාමකාමීව සිදුවිය.නොසිතූ පවුල් දෙකක් එකතු විය.

මාගේ පැත්තෙන් අස්සන් කලේ තාත්තාය සරායාගේ පැත්තෙන් හනීෆා අංකල් අත්සන් කලේය.

එලියට පැමිණ අම්මාටත් තාත්තටත් වදින විට.

තාත්තා මාව නැගිට්ටුවේ.

"නැගිටපන් චූටි අන්තිමට උඹ දින්න උඹ ඔප්පු කලා මිනිස්සු ඔක්කම එකයි කියල. "

Author
KUSHAN HETTIARACHCHI

අම්මා සරායාව වැලඳගත්තේ ආදරයෙනි.

ෆරීනා ඇන්ටීත් හනීෆා අංකලුත් මාව වැලඳ ගත්තෝය .

ඊට දවස් හතරකට පසු අප දෙදෙනාම එන්ගලංතය වෙත ගියේ ඉතාමත් සතුටිනි.

*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*-*

වසර හතකට පසු අද අප දෙදෙනා මවු බිමට පැමිණෙන දවසයි.

අවුරුදු හතර හමාරක් වයසැති අප දෙදෙනාගේ පුන්චි දියණිය "නුස්ලා "ඇයගේ ශ්‍රී ලංකාවේ සිටින ආදරණීය නෑදෑයන් දැකීමේ ආශාවෙන් පසු වෙන්නීය.සරායා සහ මමද ඒ සතුට විදීමේ ආශාවකින්

පසුවෙන්නෙමු .

නිමි

ස්තූතියි

කුෂාන් කුෂී ^

Author - Kushan Hettiarachchi 2017 OCTOBER

# සරායා

ඩේවිඩ් ඔහුගේ හුන්ඩායි ස්ටෙලා වර්ගයේ කාරය මග අයිනට වෙන්න නැවැත්තුවේය.

"උඹ සිංදුව අහපන් මන් කඩේට ගිහින් කන්න මොනව හරි ගේන්නම්. "

මම කුෂාන්. ඩේවිඩ් සහ මම නක්කාවත්ත ජාතික පාසලේ ජීව විද්‍යා අංශයෙන් උසස් පෙල කල සිසුන් වීමු .ඩේවිඩ් ගේ සහ මගේ විනෝදාංශය හවසට මේ වගේ රවුමක් යාමය .ඔහුගේ පියා මේ වාහනය අරන් දී තිබුනේ ඔහුගේ පාවිච්චියට ය.

මද වෙලාවකින් ඩේවිඩ් ආවේ එග් බන් පහකුත් කොකාකෝලා ලීටරයේ වීදුරු බෝතලයකුත් අරන් ය.

"ඈ බන් දැන් මේ බෝතලේ දෙන්න එන්න වෙනව නේද ?"

"ඇයි බන් උඹ දැක්කෙ නැද්ද මම ඩිකියෙ තිබ්බ බෝතලයක් අරන් යනව ."

"මම ඉතින් ඔය ඩ්‍රයිවර්ල කරන වැඩ බලන්නෙ නෑනේ. "

"ආ මම එතකොට ඩ්‍රයිවර් උඹ මහත්තය? "



Author
KUSHAN HETTIARACHCHI
කුෂාන් හෙට්ටිආරච්චි
www.facebook.com/kushan3000
kushan3000@gmail.com

KiYasha